# සැඳෑව

ජ්‍යෙෂ්ඨයන්ගේ අඩහැරය

මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2011 ඔක්තෝබර්

වෙබ් අඩවිය : www.sendewa.org විද්‍යුත් ලිපිනය : info@cbpa.com

අංක QD/118/News/2010 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.


## මතට තිත



මෙය ලියන මා අමද්‍යප වීරයෙකු හෝ මද්‍ය ලෝලයෙකු නොවන බව කිව යුතුය. හුදු මධ්‍යස්ථ මතධාරියෙකු පමණි. මතට තිත කාලෝචිත හා වැදගත් මාතෘකාවක් බව සැබවි. ඊට හේතුව අද මත් උවදුර ලොව පුරා වසංගතයක් මෙන් පැතිර පවත්නා යුගයක් වීමයි. ඉන් මත්කුඩු ජාවාරම ගන්නේ ප්‍රධාන තැනකි. හොර රහසේ මහා පරිමාණ වශයෙන් හා සුළු පරිමාණ වශයෙන්, (ලිංගාශ්‍රිතව, උදරාභ්‍යන්තරව හා විවිධ භාණ්ඩ තුල සඟවා) රට තුලට ගලා එන මත්කුඩු දෙස බලනවිට එය ජාවාරම්කාරයින්ට අධික ආදායම් ගෙන දෙන්නක් බැව් රහසක් නොවේ. ඒ සඳහා අධික ඉල්ලුමක් ඇති බැව් හෙළිවී තිබේ. මීට මැදිහත්ව සිටින පුද්ගලයින් රටේ නමගිය පුද්ගලයින් වීමද විශේෂයකි. රට තුල මත්කුඩු වලට ඇබ්බැහි වූවන් සංඛ්‍යාත්මකව සීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී.

මත්පැන් හා මත්කුඩු භාවිතය නිසා වර්ෂයක් ඇතුලත ලෝකයේ සිදුවන සෘජු මරණ සංඛ්‍යාව මිලියන 6ක් බැව් වාර්තා වේ. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල මරණ 60ක් පමණි. වක්‍ර මරණ සංඛ්‍යාව මීට වඩා කිහිප ගුණයක් විය හැකිය. මරණ සංඛ්‍යාවට වඩා රට තුල සිදුවන්නාවූ සමාජ හා සදාචාරාත්මක ව්‍යසනය, හොරකම්, මැරකම්, පවුල් අවුල්, ආරවුල්, කලකෝලාහල, මිනීමැරුම් හා අපරාධ බෙහෙවින්ම වර්ධනය වී තිබේ. කුඩුකාරයන් අතර පවත්නා තරගකාරීත්වය නිසා සිදුවන අපරාධ සංඛ්‍යාත්මකව වැඩිවී තිබේ. විශේෂයෙන් දනට සිදුවන මංකොල්ලකෑම්, මාල කඩාගැනීම්, ගෙවල් බිඳීම්, සොරකම් හා අපරාධ බොහොමයකට මත්කුඩු භාවිත කරන්නන් සෘජුව හා වක්‍රව සම්බන්ධ බැව් පොලිස් වාර්තාවලින් හෙළිවී තිබේ. මත්කුඩු භාවිතා කරන භික්ෂූන් වහන්සේ නමක් මහරගම පොලීසිය විසින් නොබෝදා අත්අඩංගුවට ගනු ලැබූ අතර, හෙරොයින් ජාවාරම්කාර කාන්තාවක්ද අත්අඩංගුවට ගනු ලැබීය.

මත්කුඩු මෙන්ම ඊට සමගාමීව රට තුල තවත් වසංගතයක් මෙන් පැතිර පවත්නා දෙයක් නම්, ගංජා වගාව, ප්‍රවාහනය හා බෙදාහැරීම හා භාවිතයයි. මෙය පොලීසියේ ඇස වසා ඉතා සූක්ෂමව කරගෙන යනු ලබන්නකි. කොළඹ හා තදාසන්න ප්‍රදේශවල සෑම ගමකම, නගරයකම ගංජා උරන තරුණයින් විශාල වශයෙන් ගැවසෙන බැව් පොලිස් වාර්තා අනුව පෙනීයයි. එහෙයින් මතට තිත අර්ථවත් කිරීමට නම්, පළමුව මත්කුඩු හා ගංජා ජාවාරම් නතර කිරීම සඳහා රජය විසින් දනට දියත් කරනු ලබන සියලු මර්ධන ක්‍රියාකාරකම් තීව්‍ර කළයුතු වේ. දැඩි දඬුවම් ලබාදිය හැකි අණ පනත් පැනවිය යුතුය.

මත්පැන්

1)නීතිවිරෝධී මත්පැන්(කසිප්පු වැනි දේ)

2)අවසරලත් මත්පැන්(දේශීය හා විදේශීය)

නීතිවිරෝධී මත්පැන්, මත්කුඩු හා

වෙනත් මත්ද්‍රව්‍ය මෙන් සපුරා තහනම් ඒවා බැවින් ඒවා මැඩලීම රජය හා නීතිය ක්‍රියාත්මක කරන්නවුන් සතු වගකීම වේ. කසිප්පු ජාවාරම මහා පරිමාණ වශයෙන් සෑම ප්‍රදේශයක පාහේ, මුදලාලි මට්ටමින් පැතිර පවත්නා එකකි. මෙහි විශේෂයක් නම්, ඒවා පවත්වාගෙන යනු ලබනුයේ, බොහෝවිට පොලීසියේද සහාය ඇතිව බවයි. ඇතැම් පොලිස් නිලධාරීන් මුදලාලිගෙන් කොටස ලබා ගන්නා බැව්ද කියනු ලැබේ. මෙවැනි පසුබිමක් යටතේ කසිප්පු ව්‍යාපාරය මැඩලීම අසීරු වනු ඇත. එහෙත් පොලීසිය විසින් වරින් වර කසිප්පු, ගෝඩා, බැරල් පිටින් විනාශ කරනු ලබන අවස්ථා අපමණ වශයෙන් ප්‍රදර්ශනය කරනු පෙනේ. එහෙත් මෙහි ප්‍රතිඵලය කුමක්ද? කසිප්පු සහමුලින්ම තුරන් කිරීමට හැකියාව ලැබී තිබේද? කසිප්පු ව්‍යාපාරය මැඩලීම පිණිසද රජය විසින් මීට වඩා තදබල දඬුවම් සහිත නීති පැනවිය යුතු අතර, ඔවුන් ඇල්ලීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ගද වඩාත් පුළුල් කළ යුතුව තිබේ.

**අවසරලත් මත්පැන්(දේශීය හා විදේශීය)**

අපගේ අවධානය වඩාත් යොමුවිය යුත්තේ මේ කෙරෙහිය. අන් සියලුම මත්ද්‍රව්‍ය හා මත්පැන් වලටත් වඩා මෙහි භයානක කම නිදහසයි. අද බේබදුකමට මුල් සාධකය වී ඇත්තේ අවසරලත් මත්පැන්ය. මුදල් ඇත්නම් නෛතික බාධකයන් නොමැතිකම, අවශ්‍යතාවය, පහසුවෙන් ලබාගැනීමේ හැකියාව නිසා මෙය නිදහසේ ඇති පමණින් භුක්ති විඳිය හැකිය. අවසරලත් මත්පැන් හා අන් භාණ්ඩ අතර ඇති වෙනස කුමක්ද? රජය විසින් අළුතින් මත්පැන් විකුණුම් හල් විවෘත නොකිරීමට ගෙන ඇති තීරණය මතට තිත වශයෙන් වර්තමානයේ ගෙන ඇති ප්‍රායෝගික එකම තීරණය විය හැකිය. එහෙත් කාර්ගිල්ස්, ලාෆ් හා කීල්ස් වැනි සුපිරි වෙළඳසැල් වලට රජය විසින් සුරා කුටි පවත්වාගෙන යාමට අවසර දීමෙන්, එකම මත්පැන්, සුපිරි මත්පැන් බවට පත් කොට ඇති අතර, ඉන් මත්පැන් අලෙවිය හා භාවිතය වැඩිවීමක් මිස අඩුවීමක් සිදුවී නොමැත. මතට තිත මෙසේ පැවැත්විය හැකියයි රජය විශ්වාස කරන්නේ නම් එය මුලාවකි. එකම වෙළඳ සළකුණ යටතේ වෙළඳපොලට එන හොර මත්පැන් පාලනයෙහිලා සුපිරි වෙළඳසැල් මගින් කිසියම් සේවයක් සිදු වනු ඇතැයි යන්න කෙරෙහි පමණක් විශ්වාසය තැබිය හැක.

**හොර පොල මත්පැන් වෙළඳාම**

වරක් මාත්, අභාවප්‍රාප්ත ගාමිණි එස්. ඇල්විටිගල මහතාත් රාත්‍රී 10ට පමණ මළ ගෙදරකට මත්පැන් අවශ්‍ය වී හොර පොලක් සොයා ගියෙමු. හොර පොල වටේ අප කැරකෙනු දුටු පොලීසිය අපෙන් වංහුං විමසූහ. මම නොබියව සත්‍ය ප්‍රකාශ කළෙමි. වහා ඔවුහු හොර පොල වෙත අප කැඳවා ගෙන ගොස් ''හොඳ වර්ගයේ බෝතල් 2 ක්'', ''අපට දුන් වර්ගයෙන්'' මේ මහත්වරුන්ටත් දෙන මෙන් නියෝග කළහ. සාජන්ට් මහතා තමන්ගේ අවශ්‍යතාවයන් සඳහා මෙසේ හොර මත්පැන් සල් පවත්වාගෙන යන බැව්ද අප සමඟ කීය. හොර පොල මත්පැන් ව්‍යාපාරය, අවසරලත් වෙළඳ සළකුණු යටතේ කසිප්පු මිශ්‍රිත හොර මත්පැන් ජාවාරමට රුකුලක් බැව් කිව යුතුය. හොර පොල අද පවතින්නේ, රාත්‍රී 9.00 පසු අධි ලාභ දෙන වෙළඳාමක් වශයෙනි. අවසරලත් මත්පැන් හල් 9.00ට වැසූ පසු, රජ දහනක් වනුයේ හොර පොල මත්පැන් හල්ය. රට පුරා අද බෙහෙවින්ම පැතිර පවත්නා හොර පොල මත්පැන් ජාවාරම සහමුලින්ම නතර නොකල හොත්, ''මතට තිත'' යන්න හුදු මායාවක් පමණක් වනු නියතය.

**විදේශීය මත්පැන් තහනම් කිරීමේ අවශ්‍යතා**

සංචාරක ව්‍යාපාරයේ වර්ධනයත් සමඟ විදේශීය මත්පැන් අලෙවියේ හා පරිභෝජනයේ වර්ධනයක් දක්නට ලැබිය හැකිය. ඔවුන් බහුලව ගැවසෙන හෝටල් සඳහා විදේශීය මත්පැන් අලෙවියේ පහසුකම් සැපයිය යුතුවේ. ඉන්දියාවේ විදේශීය මත්පැන් ආනයනය තහනම් කොට තිබේ. ඉන්දියාවේ ප්‍රාන්තයක නිෂ්පාදිත මත්පැන් තවත් ප්‍රාන්තයකට පවා ප්‍රවාහනය තහනම්ය. මතට තිත ක්‍රියාත්මක කිරීමෙහිලා ආනයන මත්පැන් භාවිතයේ හෝ සංචාරක ව්‍යාපාරයේ කවර බලපෑමක් හෝ නැතැයි සිතිය නොහැකිය.

**ආකල්ප වෙනස් කිරීම්**

ආකල්පයන් වෙනස් කිරීම යමක වර්ධනයට හා මර්ධනයට ප්‍රබල හේතුවක් වනු ඇත. සන්නිවේදන ඉතා දියුණු යුගයක මෙය පහසුවෙන් කළ හැක්කකි. ආකල්ප වෙනස් කිරීම යනු චිත්ත සන්ධානයන් තුල ඇති කරනු ලබන වෙනස් කිරීම්ය, රජය විසින් පනවනු ලබන නීති මඟින්ද, දඬුවම නිසාද, සන්නිවේදන මගින්ද ආකල්ප වෙනස්කිරීම්වලට භාවිත කළ හැකිය. මේ සඳහා දේශණාකාරයන්ද උපයෝගී කරගත හැකිය. දේශණාකාරයන් යනු, විවිධ ආගම්වල පූජක පංතිය හා මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා කැපව සිටින ආයතන හා පුද්ගලයන්ය.

**බෞද්ධ ආකල්පය**

බෞද්ධාගමට අනුව ''සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමනී'' නම්වේ. සුරා යනු රහය. මේරය යනු මෙරයයි. එනම් රහමෙරයි. රහ යනු රස යන අර්ථයයි. එනම් ගස්, වැල්, පළතුරු යනාදියෙන් ලබාගන්නා රසයයි. කිතුල්, පොල් ගස්වලින් ලබාගන්නා තෙලිජ්ජ රසයද, උක්, ඇපල්, දොඩම්, දෙහි, අලිගැටපේර, වැල්දොඩම් හා මිදි ආදියෙන් ලබාගන්නා රසයද වේ. මේරය යනු කුමක්ද? එනම් තනි තනිව හෝ, මිශ්‍රකොට හෝ, එකට තම්බා නිෂ්පාදනය කරනු ලබන්නකි. කසාය, තේ, කෝපි, බෙලි, රණවරා, කැඳ, සුප් වර්ග ආදිය හා වර්තමානයේ කසිප්පු නමින් හඳුන්වනු ලබන දේවල්ද මේරය වේ. මේවායින් මත් කිරීමක් සිදුවන්නේ නම් පමණක් ඒවා

"මජ්ජ" නම් වේ. සුරා වූ පමණින් හෝ, මේරය වූ පමණින් ඒවා "මජ්ජ" හෙවත් මත්පැන් නොවන බව පැහැදිලියි. සුරා හා මේරය යනු "මජ්ජ" යන්නට විශේෂණ පද පමණි.

යම්කිසි සුරාවක් හෝ මේරයක් "මජ්ජ" හෙවත් මත්වන සුළුද, මත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් "පමා දට්ඨානා" හෙවත් ප්‍රමාදය ඇතිකරවන සුළුද, එම සුරාවෙන් හෝ මේරයෙන් ඔබ වැලකිය යුතුවේ. මත්වීම කායික හා චෛතසික වේ. කායික වශයෙන් මත්වූ කල ඉරියව් පාලනය කළ නොහැකි වේ. චෛතසික වශයෙන් මත්වූ කල, ඇතැම් විට සිහිසන් (සිහිය හා සංඥා) නොමැතිව යයි. මීටත් වඩා භයානක මත්වීම් ගැන බුද්ධාගමෙහි ඉගැන්වේ. එනම් රාගයෙන්, ධනයෙන්, බලයෙන්, නිලයෙන්, උගත්කමින්, රූපයෙන්, කාය ශක්තියෙන් හා සීල සමාපත්තියෙන් මත්වීම පිළිබඳවයි. වර්තමානයේ දූෂණ, මැරකම් හා අපරාධ වලට, නිලයෙන්, බලයෙන් හා ධනයෙන් මත්වීම් හේතුකාරක වේ. සීල සමාපත්තියෙන් මත්වීම යනු තමා මත්පැන් නොබොන්නෙක්ය. එහෙයින් බොන්නන්ට වඩා තමන් උසස්ය යන මානයෙන් බැලීමයි. එය, මත් මද මානය (සිත මත්වීම නම්වූ මානය) යැයි කියනු ලැබේ. සිත තුල ඇතිවන්නා වූ මෙබඳු සියලු මත්වීම් වලටද අප විසින් තිත තැබිය යුතුවේ.

ක්‍රිස්තියානි ධර්මයට අනුව (බයිබලයේ ඇතැම් තැන්වල සඳහන් වනුයේ මෙසේය.)

බේබදුකම ගීතාවලිය 104-15 1

නිමානි 51:23

"වයින් හිර හෝ වෙනයම් මත්පැන් වර්ගයක් සුළු වශයෙන් පානය කිරීම දෙවියන් වහන්සේ ඉදිරියේ වරදක් නොවේ. එය හද රතු පැහැය ගන්වයි නම් වඩාත් ජලය මිශ්‍රකොට පානය කළ යුතුයි. එහෙත් අධික මත්පැන් පානය කරන්නාට දෙවියන් ශාප කරයි."

"අපි යමකට දාසයන් වන්නේ නම් අපි ඊට නමස්කාර කරනවා."

රෝම 6:19

"සාතන් මිනිසා නොමග යවන තවත් ක්‍රමයක් නම් තෘෂ්ණාවයි. තෘෂ්ණාව යනු ආත්ම දමනයෙන් තොර යමකට ඇති කැදරකමයි."

ගලාති 6.7.8

"මුදිත පානයෙහි ලොල් වූවන් හා මස් පිණිස ගිජු වූවන් හා එක් නොවව. සාතන් නමැති යක්ෂයා හා එක්වීමකි."

"දුම්පානය, බුලත් හැපීම හා විත්දනය සඳහා මත්පැන් ගැනීම ක්‍රිස්තියානින්ට සුදුසු නැත. මෙම පුරුදු වැරදි සහගතයි."

රෝම 6:19

ශුද්ධ වූ කුරාණයෙහි

"මත්පැන් බොන්නා යක්ෂයෙකි. ඔහු ඕනෑම අපරාධයක් කරයි. ඒ නිසා මත්පැන් ලඟ තබාගන්නාට හා බොන්නාට දඬුවම මරණයයි"

ඇබ්බැහිකම

අන් සියල්ලට වඩා ඇබ්බැහිකම පහසු වෙන් නතර කළ නොහැක්කාක් මෙන් සැළකේ. ඇබ්බැහිකම යනු දීර්ඝ කාලයක් නිසේ නොනවත්වාම පවත්වාගෙන යනු ලබන්නකි. යමෙකුට මත්පැන් බීමේ අදහසක් දවසේ නිසියම් වේලාවක නිරන්තරයෙන් චිත්ත සන්තානයට එන්නේද, ඔහු අනාර්ථිකද, එය ඔහුට ක්‍රියාවට නොනගා සිටිය නොහැක්කේද එය ඇබ්බැහි කමයි. සිතට එන පළියටම එය ක්‍රියාවට නොගන්නේද; තර්කානුකූලව සිතා බලන්නේද, එහි දෝෂ දක්නේද ඒ අනුව එය සිත විසින් පාලනය කරනු ලබන්නේද ප්‍රායෝගිකද එහි ඇබ්බැහි කමක් නොදකින්නේ වේ. මත්පැන් ඇබ්බැහි වූවන් බේබද්දන් නම්, බීමට බද්ධ වූ යනාර්ථයයි. යහපත් දේට පුරුදු වීමද ඇබ්බැහි කමයි. එහෙත් ඉන් යහපත් ඵලම ගෙන දෙන්නේය.

මතට තිත යන්නෙහි, වැදගත්ම අංගයක් විය යුත්තේ ඊට ඇබ්බැහිකම තුරන් කිරීමය. මතට ඇබ්බැහි වූවන් ස්වකීය පවුලට සමාජයට පිළිලයකි. සීමාන්තික මතට ඇබ්බැහි වූවන්ගේ දින චර්යාවෙන් වැඩි කොටසක්ම ගෙවී යන්නේ මතටමය. දවසේ පැය 24ම ඔවුන් ගත කරන්නේ මතිනි. ඇබ්බැහිකම බියර් බෝතලයේ සිට මරණය දක්වා දිව යන්නකි.

නිගමනය

"මතට තිත" යන්න චින්තනයක් පමණි. මත, ලොව පුරා වසංගතයක්ව තිබියදී, නීතියෙන් අවසර ලත් මත්පැන් ඇති රටක, එහි පැවැත්ම සඳහා බීම හල්, (Wine Stores)සියලු පහසුකම් වලින් යුත් අවන් හල් ගමක් නගරයක් පාසා විවෘතව ඇති රටක චින්තනයක් මගින් කළ හැකි කාර්යය කුමක්ද? ආකල්ප වලින් යම්කිසි ආරම්භයක් මෙන්ම විනාශයක්ද යහපතක්ද කළ හැකිය. කිසියම් චින්තනයක් ආකල්පමය වෙනස්කම් ඇතිකිරීමට සමත්ද, ඉන් ලැබෙන ප්‍රතිඵලය අති විශාලය. ආකල්පමය දක්මක් ප්‍රචාරක මාධ්‍ය, ආගමික දේශන මගින් පුළුල් වශයෙන් දියත් කළ හැකිය. මත්පැන් පානය කරන්නන් සංඛ්‍යාත්මකව අවම කරලීමටත් විෂම මත්පැන් පානය සදාචාරාත්මක මත්පැන් පානයක් බවට පත්කර ලීමටත් එය ඉවහල් වනු ඇත. මතට තිත වර්තමානය සඳහා මෙන්ම අනාගත පරම්පරාව සඳහා වන්නක් බවට පත්කර ලීමට නම් ඔවුන්ගේ ලාබාල අවධියේ දීම ඔවුන් තුල ආකල්පය වෙනස්වීම් ඇතිකළ යුතුය.

"අපගේ ජීවිතය අප විසින් පාලනය කළ යුතු දෙයක් බවට පත්කළ යුතුය. එය ආත්මීයත්වය යනුවෙන් හඳුන්වනු ලැබේ. ශුද්ධ වූ බයිබලය. (මී.කා.68.1) බුද්ධ ධර්මය අනුව "චිත්තස්ස දමතො සාධු" යනුවෙන් දක්වෙනුයේ එයයි. පාලනය ජීවිතයට අත්‍යවශ්‍ය අංගයකි. පාලනයෙන් තොර යමක් වේද, හරිහැටි පාලනයක් නොමැත්තේද, එය විනාශයක ආරම්භයයි. ඔබ ඔබගේ ප්‍රම්බනා ලැයිස්තුවේ මත්පැනට දෙන්නේ කෙබඳු තැනක්ද? එය මතට තිතට පිළිතුරයි. "මතට තිත" තැබිය යුත්තේ කවරෙක්ද? මෙය කියවන ඔබයි. "නෙව අඤ්ඤං" අනිකෙකු නොවේ.

ර.මු. සෙනෙවිරත්න

# Life can begin at 60, It is all in in your hands!



Many people feel unhappy, health-wise and security-wise, after 60 years of age owing to the diminishing importance given to them and their opinion. But it need not be so, if only we understand the basic principles of life and follow them scrupulously. Here are ten mantras to age gracefully and make life after retirement pleasant.

**1.Never say 'I'am aged':** There are three ages, chronological, biological and psychological. The first is calculated based on our date of birth; the second is determined by the health conditions and the third is how old you feel you are.While we don't have control over the first, we can take care of our health with good diet, exercise and a cheerful attitude. A positive attitude and optimistic thinking can reverse the third age.

**2.Health is wealth:** if you really love your kith and kin, taking care of your health should be your priority. Thus, you will not be a burden to them. Have an annual health check-up and take the prescribed medicines regularly. Do take health insurance cover.

**3.Money is important:** Money is essential for meeting the basic necessities of life, keeping good health and earning family respect and security. Don't spend beyond your means even for your children. You have lived for them all through and it is time you enjoyed a harmonious life with your spouse. If your children are grateful and they take care of you, you are blessed. But never take it for granted.

**4.Relaxation and recreation:** The most relaxing and recreating force are a healthy religious attitude, good sleep, music and laughter. Have faith in God, learn to sleep well, love good music and see the funny side of life.

**5.Times is precious:** It is almost like holding a horse's reins. When they are in your hands, you can control them. Imagine that everyday you are born again. Yesterday is a cancelled cheque. Tomorrow is a promisory note. Today is ready cash - use it profitably. Live this moment.

**6.Change is the only permanent thing:** We should accept change – it is inevitable. The only way to make sense out of change is to join the dance. Change has brought about many pleasant things. We should be happy that our children are blessed

**7.Englishtened selfishness:** All of us are basically selfish. Whatever we do, we expect something in return. We should definitely be grateful to those who stood by us. But our focus should be on the internal satisfaction and happiness we derive by doing good to others, without expecting anything in return.

**8.Forget and forgive:** Don't be bothered too much about others' mistakes. We are not spiritual enough to show our other cheek when we are slapped in one. But for the sake of our own health and happiness, let us forgive and forget them. Otherwise, we will be only increasing our BP.

**9.Everything has a purpose:** Take life as it comes. Accept yourself as you are and also accept others for what they are. Everybody is unique and right in his own way.

**10.Overcome the fear of death:** We all know that one day we have to leave this world. Still we are afraid of death. We think that our spouse and children will be unable to withstand our loss. But the truth is no one is going to die for you; they may be depressed for some time. Time heals everything and they will carry on.

**Sheila lekamge**
(An article published by Daily Mirror)

# සිතීමට දෙයක් !

"සිතීම වනාහි තිසියම් පුද්ගලයකුගේ ආත්මීය ඔහු සමග කථාකිරීමය" - ප්ලුටෝ

***********

ආලෝකයට වඩා ඉතා අඩු වේගයකින් ශබ්දය ගමන් කරන බව විද්‍යාඥයෝ කියති. එය සැබෑය. මක් නිසාද යත්, ඔබගේ දරුවන් කුඩා වියේදී ඔබ ඔවුන්ට කියන දේ, ඔවුන්ට ඇසෙන්නේ ඔවුන්ගේ මැදි වියේදීය.

***********

අනාගතයේදී ඛනිජතෙල් ලබා ගන්නා මාධ්‍යය වනුයේ මහ මුහුද යැයි කියනු ලැබේ. එය සැබෑය. මිනිසා මුහුදු ජලයට මේ තාක් මුසුකර ඇති ඛනිජ තෙල් කොපමණ ටොන් ගණනක් එහි තිබේද?

***********

"කියවීම අංග සම්පූර්ණ මිනිසෙකු ඇති කරයි" යනු ප්‍රැන්සිස් බේකන්ගේ කියමනෙකි. එහෙත් වර්තමානයේදී රූපවාහිණිය ඉදිරිපිට වාඩි වී කමින් බොමින් පැය ගණන් එය නරඹන මිනිසුන් හා ඔවුන් හරවන සැටි බලන විට, රූපවාහිනිය බැලීම ඊටත් වඩා සම්පූර්ණ මිනිසුන් ඇති කරන බව නිර්භයව ප්‍රකාශ කළ හැකිය.

***********

"එපා දෙය නැති නොකරනු" යනු පැරණි කියමනෙකි. එහෙත් මෙය සැමදෙනාම ක්‍රියාත්මක කළහොත්, ලෝකය පුරාම කුණුගොඩවල් මිස වෙනත් ඉඩක් නැතිවන බව මට සිතේ.

***********

ගෙදරක අඹු සැමි දෙදෙනා අතර ඉඳහිට ඇති වන දබර හේතු කොට ගෙන සාර්ථක විවාහ ජීවිතයක් පවත්වාගෙන යා හැකි බව මානසික විද්‍යාඥයෝ කියති. එය සැබෑය. එසේම එය හේතුකොට ගෙන ඉතා සාර්ථක මනෝ විද්‍යාඥ පිරිසක්ද අනිවාර්යයෙන්ම ඇතිවේ.

***********

"වාසනාව උදා වීම නිසා මිනිස්සු වෙනස් වන්නේ නැත. එයින් වන්නේ ඔවුන්ගේ ප්‍රකෘති තත්වය පෙන්වා දීමය.

***********

පනින්ට පෙර සිතා බලනු", යැයි ආප්තෝපදේශයක් ඇති අතර අපි එය බොහෝ විට ගුරුකමට ගනිමු. සෙස්සන්ටද මෙය කියා දෙමුත එහෙත් "අද කළ යුතු දේ හෙටට කල් නොදමනු" හා "වැඩ කල් දැමීම කාලය කා දමයි" යනුවෙන් ආප්තෝපදේශ දෙකක් තිබේ.

P.W. ප්‍රනාන්දු

# බ්‍රේක් බ්‍රේක් බ්‍රේක්



වීදියියේ ඇති වූ ගින්නකින් විශාල කර්මාන්ත ශාලාවක් දවෙන්නට පටන් ගත් කල, එයින් කලබලයට පත් එහි හිමිකරු විසින් නගරයේ තිබුණු ප්‍රසිද්ධ ගිනි නිවීමේ හමුදා කීපයක්ම කැඳවන ලද නමුත්, ගිනි ජාලාව දකින්ම කියට පත්ව එය නිවා දැමීමට නොහැකි බව කියමින් ඔවුහු සියල්ලෝම ආපසු ගියහ.
එහෙත් අවසානයට කැඳ වූ අප්‍රකට කුඩා ගිනි නිවන කණ්ඩායමක්, අබලන් ලොරි භාගයක නැගී විදුලි වේගයෙන් පැමිණ බුර බුරා නැගෙමින් පැවති ගිනි ජාලාව මැදටම කඩා පැන මහත් ආයාසයක් දරා මිනිත්තු කීපයකදී මහා ගින්න මැඩ පැවැත්වීමට සමත්වීම කාගේත් විමතියට හේතු විය.
එලෙසින් තම කර්මාන්ත ශාලාව විශාල විනාශයකින් බේරා දීම ගැන මහත් සේ සතුටට පත් එහි හිමිකරු ගින්න නිවා අවසන් කර දුම් අතරින් එළියට ආ ගිනි නව කණ්ඩායමේ ප්‍රධානියාට නොසෑහෙන අයුරින් ස්තුති කරමින්, තමා ඔවුන්ටගෙවීමට පොරොන්දු වූ මුදලට අතිරේකව තවත් රුපියල් පනස් දහසක මුදලක් ''සන්තෝෂමක'' වශයෙන් දෙමින් මෙසේ විමසා සිටියේය.
''ඔබගේ නව කණ්ඩායමේ නිර්භීතකම ගැන අපිට හරිම ආඩම්බරයි. හැම දෙනාම එකා වගේ තමන්ගේ ජීවිතේ ගැනවත් නොතකා පැන පැන ගින්න නිවන්න වෙහෙසුනු හැටි අපි කවුරුත් හොඳින්ම දැක්කා. ඒ වෙනුවෙන් මේ දෙන වැඩි පුර මුදල ඔබ ඔවුන් අතර බෙදා දෙයි කියලා අපි විශ්වාස කරනවා.''
ඒ ඇසූ කණ්ඩායමේ ප්‍රධානියා තම ඇඟ පුරා තැවරුණු කළු දුම් රොටු පිස දමමින්ද, හති අරිමින්ද මෙසේ පිළිතුරු දෙන්නට විය.

''පිස්සු කථා කරන්න එපා මිස්ටර්, ඔක්කෝටම කලින් මේ මුළු මුදලම වියදම් කරලා හරි අපේ ලොරියේ බ්‍රේක් හදාගන්න ඕනෑ. ලොරිය නවත්වා ගන්න බැරිව ගින්න මැදටම ගිය නිසා තමයි ඒ විදිහට ෆයිට් කරලා, ගින්න නිවලා අපේ ජීවිත බේරා ගන්න සිද්ධ වුණේ.''

ගාමිණී චන්ද්‍රසේන
මා කොළ

# 2011-07-08 දින අධිපති හමුව

2011-04-30 වන අලුතින් පත්වූ විධායක කමිටුවට ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමා හමුවීමට 2011-07-08 දින අවස්ථාව උදාවිය. මෙම හමුවීම සඳහා ලබා දී තිබූ කාල වේලාව විනාඩි 30 කට සීමාවිය. එහිදී පහත සඳහන් යෝජනා සංගමයේ සභාපති විසින් අධිපතිවරයා වෙත යොමු කරන ලදී.

01. ශ්‍රී ලංකා මහ බැංකුවට 60 වසරක් පිරීම නිමිත්තෙන් විශ්‍රාමිකයින් වෙත ලබාදෙන ලද රු:7500/- යේ පාරිතෝෂිතය කිසිසේත් ප්‍රමාණවත් නොවන අතර ඒ පිළිබඳව විශ්‍රාමිකයින් මහත් කළකිරීමකට පත්ව සිටින බව පෙන්වා දෙන ලද අතර මාසික වැටුපක් පාරිතෝෂික වශයෙන් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.
02. පසුගිය කාලය පුරාවටම විශ්‍රාම වැටුප වැඩි කරන ලද්දේ ඉතාම සුළු ප්‍රමාණයකින් නිසා විශ්‍රාම වැටුප් විෂමතාවයක් ගොඩනැගී ඇති බව පෙන්වා දෙන ලද අතර ඒ පිළිබඳවත් වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමයේ ප්‍රශ්න පිළිබඳවත් වෙන වෙනම සාකච්ඡා කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා නියෝජ්‍ය අධිපතිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.
03. විශ්‍රාමිකයකුගේ මරණයක් වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් සංගමය මගින් මල් කළඹක් තබන අතර එහි වියදම ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපූර්ණ කරනු ලැබේ. නමුත් ගමන් වියදම් ප්‍රතිපූර්ණ නොගෙවන බව පෙන්වා දුන් අතර, එයද ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.
04. විශ්‍රාමිකයන්ගේ සංගමයේ කටයුතු සඳහා ශ්‍රී ලංකා මහ බැංකු පරිශ්‍රයෙන් ස්ථානයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

අධිපතිතුමාගේ ප්‍රතිචාරය පහත පරිදි විය.

i. 60 වසරේ සංවත්සරය සඳහා පාරිතෝෂිතය ලබාදීමේදී, අනිකුත් ආයතන එවැනි අවස්ථා වලදී කටයුතු කර ඇති ආකාරය සැලකිල්ලට ගත් බවත්, සැලකිල්ලෙන් එය තීරණය කළ බව පවසන ලදී.
ii. දෙවැනි කරුණ පිළිබඳ එකඟත්වය පලකරන ලදී.
iii. මල් කළඹටත් ගමන් වියදම් යන වියදම් දෙක සඳහා රු.2500/- ක උපරිමයට යටත්ව ගෙවීම් කිරීමට එකඟ විය.
iv. ශ්‍රී ලංකා මහ බැංකු පරිශ්‍රයෙන් ස්ථානයක් ලබාදිය නොහැකි බව දැන්වූ අතර, බාහිර ස්ථානයකින් ඒ සඳහා ස්ථානයකින් කුලී පදනමට ලබා ගන්නා ලෙස දැන්වූ අතර, කුලිය ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ප්‍රතිපූර්ණය කර දීමට එකඟ විය.

# ඩොක්ටර් X

ඩබ්ලිව්. ඒ. මාතුපාල පෙරේරා මහතා පානදුරේ සිට කෝච්චියේ වැඩට ආයේය. මහ බැංකුවේ වෙනත් දෙපාර්තමේන්තුවක සේවය කළ X ඔහුගේ හොඳම මිතුරෙක් විය. දෙදෙනාම නිතරම පාගේ එකට කෝච්චි පෙට්ටියේ ගමන් ගත්හ. ඒ. මාතුපාල පෙරේරා මහතා, තමාගේ මුල් පත්වීම ලබාගෙන සේවයට එන යුගයයි. ඉතාමත් නිහතමානී පුද්ගලයෙකු වූ X සමග "මචං මචං" යයි අමතමින් ඔහු කෝච්චියේ එයි. මේ අතර මාතුපාල පෙරේරා මහතාට දෙසතියකින් පමණ පසු වෙනත් දෙපාර්තමේන්තුවකට මාරුවක් ලැබිණ. එහිදී වැසිකිලියේදී කෝච්චියේ මිතුයා හමුවිය. මිතුය අමතා ඔහු මෙසේ කීය. "මචං උඹත් වැඩ මෙහෙද? මාත් අද ඉඳල මෙහෙට ට්‍රාන්ෆර් බන්. වැඩ කොහොමද? ඕවර්ටයිම් පාරක් හෙම ගහන්ට තියෙයිද? හාන්සි පාරක් දාගන්ට පුළුවන් තැනක් ලැබුණොත් නම් හොඳයි." කියායි. X ගත් කටටම සිනාසී, "පුළුවන්" යයි කීය. මාතුපාල පෙරේරා මහතා පසුව අසුනට වී වාඩිවී සිටියාට පසුවයි, X දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා යැයි දැනගත්තේ. මාතුපාල මහතා, "සර්, මට සමාවෙන්නැ"යි X ගෙන් අයැදීය. "ඕවා ගණන් ගන්න එපා" යැයි X පැවසීය. තමාට වූ අකරතැබ්බය මගේ හිතමිත්‍රයෙකු වූ මාතුපාල මහතා මා සමග පැවසුයේ එසේයි. X ගේ නම කවරෙක්දැයි මට මතක නැත. ඇතැම්විට ඒ. ආචාර්ය ජයතිලක මහතා විය හැකියි. එකල මෙකල මෙන් ටයි පටි බැඳීම දෙපා. ප්‍රධානීන් විසින් නොකරන ලදී.

ර.මු. සෙනෙවිරත්න

# 08/07/2011 meeting with the governor

The new Executive Committee of the Central Bank Pensioners' Association met the Governor of the Central bank, on July 8, 2011. The meeting however, was limited to a mere 30 minutes and during the short period the following proposals were put forward for the attention of the Governor by the president.

01.The president opening the discussion pointed out that the pensioners are very disappointed with the very insignificant payment in a sum of Rs. 7,500/= made to them in celebrating the 60th Anniversary of the establishment of the Central Bank of Sri Lanka and as it was grossly inadequate would request for a lump sum payment of one month's gross pension instead.

02.It was pointed out that the insignificant increase of the pension throughout had caused much heartburn and created an inevitable anomaly and in the same breath a request was made to grant an opportunity to discuss the problems prevalent in the Medical Benefit Scheme with a Committee headed by a Deputy Governor.

03.While appreciating the bank's goodwill gesture in reimbursing the cost of the wreath provided by the Association as a representative of the bank at the funeral of a member, the transport cost which has become substantial now was not reimbursed and was therefore requested to reimburse the cost of transport as well in the future.

04.It was also requested to provide space in the Bank's premises to house the office of the Association.

The governor's response was as follows for 1, 2, 3, and 4 above.

I. In deciding the quantum of the special payment for the 60th Anniversary celebrations, the Bank had considered how other establishments had acted in similar situations and it was found that the decision taken was in accordance with the international practice the Governor said.

II. The Governor agreed with the observations in item 2 above.

III. It was agreed to reimburse the cost of the wreath and transport provided both to a maximum of Rs. 2,500/=

The Governor said that it is not possible to provide space in the Bank for the office of the Association but agreed to reimburse the rent payable for a building outside.

**Quiet moments**

Quiet moments
spent alone
in deep and sincere prayer
bring spiritual healing
to the weary mind.

Trust -
In the goodness of The Lord
Know
That He is there, with you.
Experience
the tranquility that soothes you
thoughts that inspire you,
Love that enfolds you,
Making you anew

Relax
Let the Lord guide you
along new paths
filling you
with strength divine
to face each dawning day.

**Yvonne Amarasekara**

## හැට එක පිරෙන මවට දෙවූ දරුවෙකුගෙන්

ඇති රස බොජුන් වෙනි සැණකෙලි නැති නිමිමේ
ගොඩ දැමූ පැටවූ ටික ඇයි පසෙකට දැමිමේ
මවු සෙනෙහස දැනෙන් දරුවන් වුණු බැමිමේ
අපෙ සුහ පැතුම් හැට එක සපිරෙනා අම්මේ

නැතිකම නිසා සිත් තලවන දහම්ගැට
අපි හට වුනේ එකනැතකම ලගින්නට
රුදු හොණ සැරෙන් එක පිට එක කම්න්බැට
ගිහ බල කලා එළියට පිය නගන්නට

තිලු හඩ ඇසෙන විට ඔබ හිටියත් නින්දේ
ගිත ඇති අයට රහ ගුණ දැනුනාලු නැන්දේ
පිට වුන කමට සිටසිට රතු ඉරි ඇන්දේ
ගිය අඩ හැරෙන් අප නැතැ සුර සැප වින්දේ

නොසිතුව ලෙසක ඔබ ඇද වැටුනාම අකලේ
සම්හරු ලොවෙන් නැති, ඇති අය සිහි විකලේ
තිර අදිටනින් යලි ගොඩගන්නට එකලේ
දිරි තිලු පැවටි ටික හට මොනවද නොකලේ

බැරිකම පහසුකම් ලොකු පොඩිකම් දෙවිට
දමමින් ගිහට වෙර දුනි පඩකම් පොටිට
මැද මර උගුල් ඇනගෙන වීදුරු කටිට
ඔබ ගොඩ ගන්න අපි කරගැනුවෙමු මුට්ට

නැගු සෝ සුසුම් තවමත් රළ අතර හැපේ
ලෝ දම් දැනපු කොට මොන එහෙනට ද සැපේ
මහ රැජිනියක වුනෙ ඔබ හැඩ වෙමින් ඔපේ
හෙලු දහඩියෙන් තොට ගැලු ලේවලින් අපේ

නැත දරුවෙකු තබා කිසිවෙක් ලගඉන්ට
පුන් බුන් ගොඩක වුනි දිවියෙන් සමුගන්ට
මැරි මැරි නමයි ඇතිතව ජීවත් වෙන්ට
ඔබ දුටු නෙතින් යලි නොදකින දරුවන්ට

අප නැමදෙන දමා ගිනි මැලයක් මැද්දේ
මොනවද ඇති කලේ මේ හැතිකර යුද්දේ
සමයෙක සැදැ හිටියත් නැති කොට සද්දේ
පිය හැට වියක බැරි බර කවුරුද ඇද්දේ

හැට විය ලබන කොට හොද සැලකිලි විදපු
නිල් රතු කොළ වලින් තව ඉහලට නැගපු
වාසිය සොයන්නට බොරු බිල්ලන් මවපු
මිනුන් ඉන්නවනෙ අපෙ අයිතිය හොයපු

වැඩිහිටි අයට ලොකු වෙනවලු ඉලක්කම
ඇති නම් ගතැකි මැටියෙන් කල පදක්කම
අරුමකි කරුමයකි හිතනට නොහැක්කම
එනතට වැටෙන බව ඔය නැව තෙනෙක්වම

ගිස ගිනි ගෙන වගේ තිබුනත් වැඩ කතර
දුක සැප දෙකේදිම මුණ ගැහුනෙමු නිතර
එකලදි දුනුනු සුව සෙනෙහස අප අතර
නැතැ මහ ගෙදර අද ඒ තරමට විතර

රුපියල් වලට බැරි නැම දේ කරන්නට
දූවී සිත් මනම හැකිවෙද දිවි ගෙවන්නට
යුතුකම් දහම් ගැන මොහොතක් සිතන්නට
පතනෙමු ඔබට නැණ විරිය ලැබෙන්නට

මහ බැංකු විශ්‍රාමිකයෙක්

---

## අටලෝ දහම

1. සපර වියනක් සතුට ඉපදී රනින් මාලිග ගොඩ නගන්නෙත්
   සතර ගිනියම් බව දනෙන්දින් සිසිල ඇයි නිතතුරු පතන්නෙත්
   නොසිර දිවියට කොරවූ බැඳගෙන කේන්දර පිටු ඇයි ලියන්නෙත්
   සසර සරනා තුරා සතනට කඳුල සිනහව උරුම වන්නෙත්

2. ගලන ජලකඳ බෙදිය හැකිවෙද එමත හරනා ඉරක් ඇන්දත්
   හමන වා රැළි නිසල වේවිද කවුරු තරගෙට දලක් බැන්දත්
   වයන වැයුමේ රසය අඩුවෙද සවන් පත් දොරගුලු දමුවත්
   රඟන මයුරා නතර වේවිද පිලක් හැරනත් කෙනෙක් හැඩුවත්

3. පුෂ්ල බිසවගෙ පහස දිනුවේ රජ නොගවී දස්කොන්ය මත්මත්
   නිමල් මල් වෙත බිඟුන් නාවත් ලකර බව අඩුවේද කවදත්
   හබල තිබුණොට ඔරුව නැතිනම් ගඟක් තරණය හැකිද බලවත්
   කිරල පැටියා වෙනස් වේවිද කෙලෙන් බැද්දත් කිරෙත් බැද්දත්

4. විශදන හැදවත් විදවා විදවා වියරු වන්නට දනි ලෝකය
   සමන් මාලනී කුසුමන් සුවඳ දෙන්නෙත් අඳුරු රැක
   මටත් කිමට සතුව් ඇත්තෙත් එකම කරුණකි මෙන්න මේකය
   මගේ සැනසුම ලගාවන්නේ සොහොනෙ රතුමල් පිපුණු දාකය



සඳුන් විජේසිරි (3001)

### සොඳුරුද මෙතරම් සොබාදම

හිරු රැස් ගලා විත් තුරු ගොමු මතු පිට ට
දවසක් උදාවෙයි කාගෙත් සැනසුම ට
සැම දෙන හඬිසරව යෙදුනත් වැඩ වල ට
දුක සැප බෙදී යනවා පෙර පින් ලෙස ට

පෙර තුන් යමේ රැඳි පිනි පොද තුරු මත් තේ
හිරු දුටු සැනින් මිණි කැට මෙනි පැහැගත් තේ
සුළු මොහොතකින් ඒ සැම වියැකී ගත් තේ
එනමුත් කුසුම් සැම තැන සුපිපී ඇත් තේ

සර සර හඬින් සුළඟින් තුරු සැලෙන විට
තුරුපත් සමඟ මල් ගිලිහෙයි පොළව පිට
සුන්දර දසුන් මෙලෙසින් දිස් වෙනා විට
හද තුල නැගෙන ඉමහිර කිව නොහැකි මට

ලේනුන් ඇවිත් අතු අග එහෙ මෙහෙ දුව හි
සියොතුන් නද දෙමින් ගී හඬ පතුර ව හි
මීමැසි බඹර කැල ගුම් නද දී සර හි
සොබා දහම මගෙ සිත පුමුදිත කර හි

වඳුරන් පැටවු බඩ බැඳ එහෙ මෙහෙ පනි හි
කුරුලුව අරන් ආදර පෙන්වා රඟ හි
මෙතරම් සොඳුරු දේ තිබුනත් ලොව පැව හි
මිනිසුනි කිමද නොබලනු මොහොතක් නැව හි

රංජනී සෙන්දනායක (3040)

## මද්‍යලෝලත්වය ඇතිවේගෙන එන බවට අනතුරු ඇඟවෙන සලකුණු මොනවාද?

සමාජ ආශ්‍රයට පමණක් බීමට පුරුදු වී සිටි පුද්ගලයෙක් කෙමෙන් මත්පැන් වලට සම්පූර්ණයෙන් ඇබ්බැහිව ඊට වහලෙක්ව සිටී දැයි නිශ්චය කිරීමට පහත ප්‍රශ්ණ වලට සපයන උත්තර අවංක සත්‍ය පිළිතුරු විය යුතුය.

මෙම ප්‍රශ්ණ මාලාව බෝල්ටිමෝර් විශ්වවිද්‍යාල ආරෝග්‍යශාලාවේ "ජෝන් හොප්කින්ස්" මහතා විසින් යම් පුද්ගලයකු මත් පැනට වහලෙකු වී ඇති දැයි නිශ්චය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබයි.

උත්තර සැපයීමේදී "ඔව්" හෝ "නැත" යන්න පමණක් කියන්න.

01. මත්පැන් නිසා ඔබේ රාජකාරී කටයුතු අහපසු වුණු අවස්ථා තිබේද?
02. මත්පැන් බීම ඔබේ ගෘහ ජීවිතය නොසතුටට පත්කරන්නේද?
03. මත්පැන් බීම සිදුකරන්නේ අන්‍යයන් සමග ආශ්‍රය කිරීමට ඇති ලැජ්ජා බව නිසාද?
04. ඔබ කවදා හෝ මත්පැන් බීමෙන් පසුතැවිලි විද?
05. මත්පැන් බීම නිසා ඔබේ හොඳ නමට කැළලක් විද?
06. මත්පැන් බීම නිසා ආර්ථික අපහසුකම් (මුදල් අගහිගකම්) ඔබට ඇතිවී තිබේද?
07. මත්පැන් පාවිච්චියේදී ඔබ වඩාත් පහත් යැයි සම්මත පුද්ගලයින් සමඟ අයහපත් ක්‍රියාවලට පෙළඹෙනවාද?
08. මත්පැන් බීම නිසා ඔබේ පවුලේ සුබසිද්ධිය තකා කලයුතු කාර්යයන් අහපසු කරනවාද?
09. මත්පැන් බීම නිසා ඔබේ මතු අභිමතාර්ථ, බලාපොරොත්තු අඩුවී තිබේද?
10. දිනපතා කිසියම් නියමිත වේලාවකට ඔබට මත්පැන් ගැනීමට සිතේ ආශාවක් උපදිනවාද?
11. පසු දිනයේ උදයේ ඔබට මත්පැන් ගැනීමට අවශ්‍යද?
12. මත්පැන් බීමෙන් ඔබේ නින්දට කරදර ඇතිව තිබේද? (නැතිනම් හොඳ නින්දකට මත්පැන් අවශ්‍යද?)
13. මත්පැන් බීම නිසා ඔබේ කාර්යක්ෂමතාවය අඩුවී තිබේද?
14. මත්පැන් බීමෙන් ඔබේ රාජකාරිය හෝ ව්‍යාපාරය අසාර්ථක වූයේද?
15. ඔබ මත්පැන් බොන්නේ කරදර වලින් ගැලවීමටද?
16. හුදෙකලාවට ඔබ මත්පැන් බොන්නේද?
17. මත්පැන් බීමනිසා ඔබේ සිහිකල්පනාව නැතිව ගිය අවස්ථා තිබේද?
18. මත්පැන් බීමනිසා ඔබ වෛද්‍ය ප්‍රතිකාර ලැබූ අවස්ථා තිබේද?
19. ඔබ මත්පැන් බොන්නේ ආත්ම විශ්වාසය තහවුරු කර ගැනීමටද?
20. මත්පැන් බීම නිසා ආරෝග්‍ය ශාලාවකට හෝ වෙනත් යම් ආයතනයකට ගොස් ප්‍රතිකාර ලැබූ අවස්ථා තිබේද?

ඉහත සඳහන් ප්‍රශ්න වලින් එකකටවත් ඔබ දුන් උත්තරය "ඔව්" නම් ඔබ මත්පැන්වලට වහල් විය හැකි බවට යම් සාධක ඇත. ප්‍රශ්න දෙකකට දුන් උත්තරය "ඔව්" නම් මත්පැන් වලට වහල් වී ඇති බවට හොඳ සාධක ඇත. ප්‍රශ්ණ තුනකට හෝ ඊට වඩා දී ඇති පිළිතුර "ඔව්" නම් ඔබ නිත්‍ය වශයෙන්ම මත්පැනට වහල්ව ජීවත්වන පුද්ගලයකු බව අවධාරණයෙන් කිව හැක.

-Sinhala translation by the late N.L Abeyawardana, Senior Sinhala Translatior, Central Bank, submitted by S.B Croos formally of the welfare Dept. Central Bank to "Sandewa"

# එක්තරා අමතක නොවන සිද්ධියක්

මෙය සිදුවූයේ 1970 දශකයේදීය. එවකට මම විනිමය පාලන දෙපාර්තමේන්තුවේ "ජී" ශාඛාවේ සේවයේ යෙදී සිටියෙමි. ඒ ශාඛාවේ මා සමග සිටි සෙසු සගයින් නම්, රොමානිස් සෙනෙවිරත්න, අමරසේකර, ධම්පාල, සී.බී. ජයසේකර, වියුරන් සිල්වා ආදීන්ය. කාන්තාවන් වූයේ පද්මිණී සිල්වා, රෝහිණී ප්‍රනාන්දු හා බුද්ධිමතී ප්‍රනාන්දුය.(දැන් නිවසේ හුදෙකලාව කාලය ගතකරන වයස්ගත මට මේ සගයින් ගැන මතක්වනවිට සිතට නැගෙනුයේ ඉමහත් සතුටෙකි!)

එක් සිකුරාදා දිනෙක අප හිතමිතු ජයසේකරගේ මෑණියන් අභාවප්‍රාප්ත වී ඇතිබව දැනගන්නට ලැබිණි. ඇයගේ අවසානය ලැබ ඇති බව දැනගත් ජයසේකර කලින්ම ගමට ගොස් සිටියේය. ගම බදුල්ලේ හිඳගොඩය. ඒ සති අන්තයක් නිසාත්, නිවාඩු ගැනීම ප්‍රශ්නයක් නොවන නිසාත්, බදුල්ලට යන දීර්ඝ ගමනේදී හොඳින් විනෝදවිය හැකි නිසාත්, අපි මහත් උද්යෝගයෙන් මේ ගමන යෑමට සූදානම් වීමු. අපගේ ශාඛාවෙන් හා බැංකුවේ සෙසු අංශවලින් මේ අවමඟුලට සහභාගිවූවන්ගේ සංඛ්‍යාව විස්සක් පමණ විය. එවකට "ඉඳි පඳුරට වුවත් නොපැකිලව පනින" තරුණ වියේ සිටි මේ සියලුදෙනාම හොඳින් කන බොන, නටන, සිංදු කියන, ඕනෑම දේකට එඩිතරව පෙරට එන විනෝදකාමීහු වූහ. අපි දුම්රිය වොරන්ට් ලබාගෙන රාත්‍රී 8.15ට කොළඹ කොටුවෙන් බදුල්ල බලා පිටත්වන "උඩරට මැණිකේ" දුම්රියෙන් ඒ ගමන යෑමට කතා කර ගතිමු.

මේ පිරිසේ සංවිධායකයා, නායකයා, නඩේගුරා වූයේ W.R. සෙනෙවිරත්න හෙවත් අප සුරතල් නමකින් හැඳින්වූ රොමායා. පිරිසේ සෑම අයෙකුම ඒ කාලයේ බහුලව තිබූ රු.10/-කට මිල නියම වූ "ඇරැක්" (ARAK) යන ලේබලය ගසා ඇති අරක්කු බෝතලයක්ද, කට ගැස්මද, හැකි තරම් විශාල ප්‍රමාණය ක ... රාතු කෑමද ගෙන ... ආ යුතු විය. ... මට නියමවූයේ ඉඳිආප්ප දෙසීයයක් රැගෙන ඒමටය. අමරසේකරට පොල් සම්බෝල නියම කරන ලදී. ඒ ඔහු පොල් බහුල වාද්දුවේ සිට පැමිණෙන නිසාය. සෑම දෙනෙකුටම මෙසේ යම්කිසි දෙයක් නියම කෙරිණි. අපගේ නඩේගුරා සමග වාද, තර්ක කිරීම බැරිය. ඔහු කියන දේ කරබාගෙන ඉටුකළ යුතුය.

සවස 7.00ට පමණ කොටුව දුම්රියපොළට පැමිණි අපට දකින්නට ලැබුනේ සෑම අයෙකුම ගමන්මළු පුරවා කෑම බීම ගෙනවුත් ඇති බවය. ගමන අතිශයින්ම සාර්ථක වන බව පෙනිණි. එහෙත් අප මේ යන්නේ විනෝද ගමනක් නොව අවමඟුල් ගමනකි. වන්නාටය! අපට මුළු රැයක් තිස්සේ දීර්ඝ ගමනක් දුම්රියෙන් යෑමට ඇත්තේය. ඉතින් ඒතරම් දුර ගමනක් අප ජීවිතේ විනෝදකාමීන්ව නිකම් බුම්මාගෙන යා හැකිද?

අපට දුම්රියේ නිදන මැදිරි ලබාගත නොහැකි විය. එසේ වුවද M.G.D. සිරිවර්ධන නම්, නිදන මැදිරියක් වෙන් කැරගෙන තිබුණේය. අපට ලැබුණේ "ස්ලිප්රට්" (SLEEPRET) නමින් හැඳින්වෙන ඇඳන් හා සමාන දිග ආසනවලින් යුත් මැදිරියය. සිරිවර්ධනද සිය නිදන මැදිරිය හැරදමා මේ අංශයට පැමිණ අපත් සමග විනෝද වෙමින් බදුල්ල දක්වාම ගියේය.

දුම්රිය හරියටම රාත්‍රී 8.15ට ගමන ආරම්භ කළාය. ඇය යන්තම් රාගමට ළඟා වන්නට ඇත. අපේ අය ළඟ තිබූ බෝතල් ඇර, "වෙස්"ද අනුපානයට ගෙන කමින් බොමින් ගී ගයන්නට පටන් ගත්හ. ස්වල්ප වේලාවකින් දුම්රිය පරීක්ෂකයෙක් විදුලි පන්දමක්ද අතැතිව මේ කාලගෝට්ටිය කුමක්දැයි පිරික්සීමට ආ විට, විනාරණ ඔහුටද මත්පැන් වීදුරුවක් හා කටගැස්ම පිඟානක් පිරිනැමීය. පිරිස බොහෝ වූ හෙයින් ඔවුන් නිහඬ කරවීම කළ නොහැකි බව ඔහුට වැටහෙන්නට ඇත. "මහත්තයලා ශබ්දයක් සද්ද කරන්ට එපා, මේ නිදන මැදිරි නේ. මෙතෙක අනික් අයට නිදාගන්ට බැරිවේවී" යනුවෙන් ඔහු අපට ඇවිටිලි කළේය. ඝෝෂා නොකරන්නට අපි ප්‍රතිඥා දුන්නෙමු. විනාරණ පිරිනැමූ බීම හා වෙස් ප්‍රතික්ෂේප කළ ඔහු ස්වල්ප වේලාවක් අප සමග රැඳී සිට අප ඝෝෂාව අඩුකළ හෙයින් සෑහීමට පත්ව සෙසු මැදිරි පරීක්ෂා කිරීමට නික්ම ගියේය. කෙසේ හෝ අප මැදිරියේම සිටි තරුණ යුවලකගෙන් ඝෝෂා කිරීම පිළිබඳව විනාරණ සමාව ඉල්ලා සිටියේය.

මෙසේ අප කමින් බොමින් ප්‍රීතිවෙමින් යන අතර, අපේ මිත්‍ර රොමා පොල්ගහවෙලදී දුම්රියට ගොඩවිය. එතැන් සිට අපගේ ගමන අතිශයින්ම විනෝදජනක වූයේය. ඔහු නම් නියම විනෝදකාමියෙකි. ගෝනි බාගයක් පමණ ප්‍රමාණයේ

මල්ලක් පුරවා ඔහු කටගැස්ම ගෙනැවිත් තිබුණේය. බෝතල්ද හයක් විය. එතැන් පටන් වූයේ නියම පාටියකි. ගී කීම පමණක් නොව නැටීමද පටන් ගැනුණි.

රාත්‍රී කෑමද අප ගෙන ගොස් තිබුණෙන් ඒවා සියලු දෙනාම එකතුව භුක්ති වින්දෙමු. ඉඳි ආප්ප, පොල් සම්බෝල, සීනි සම්බෝල, අල බැදුම, මාළු ඇඹුල් තියල්, පාන් සැන්ට්විච් ආදිය යහමින් ගෙනැවිත් තිබුණේය. මේවා සියල්ලම කෑ නමුත් කිසිවෙකුත් වතුර බිව්වේ නැත. සෑම දෙනාම බිව්වේ අරක්කුය!

මෙසේ කමින් බොමින්ද, ගී ගයමින් හා නැටීමෙන්ද ඒ රාත්‍රියේ මුල් යාම දෙක ගත කළ අපට, පාන්දර 5.00 පමණ වෙද්දී අපේ දුම්රිය පට්ටිපොළ වැනි ස්ථාන කරා ළඟාවූ විට, මේ දිවයිනේ ඕනෑම අයෙකු වශී කරවන සුළු වෙනත් කිසිම ප්‍රදේශයක දක්නට නොලැබෙන. අතිශයින් රමණීය මනහර දර්ශනයක් දකින්නට හැකි විය. මම නම් එවැනි දර්ශනයක් ජීවිතයටම දැක නැත්තෙමි. ඒ කඳුරටට හිරු උදාවයි. අහසේ ලස්සන රන්වන් පාට වලාකුළු කඳු ශිඛරවලට හා ගස්කොළන්වලට පසුබිමින් පෙනෙනවිට, එය නම් අතිශයින්ම රමණීය වූ දර්ශනයෙකි! ලංකාවේ වෙසෙන සෑම අයෙකුම දැකිය යුතු රමණීය දර්ශන ත්‍රිපයක්ම ඇත. පළමුවැන්න, ශ්‍රීපාදයේ සිට දකින ඉර සේවයයි; දෙවැන්න, මෙහි සඳහන් කල දර්ශනයයි. තුන්වැන්න, අලිමංකඩ පෙනෙන ඉර උදාවේ හා ඉර බැසීමේ දර්ශන දෙකයි; සිව්වැන්න, යාපනේ කයිට්ස් දූපතට පෙනෙන ඉර බැසීමේ දර්ශනයය.

දුම්රිය කඳු අතරින් ඇදෙමින් පෙරට යනවිට දක්නට ලැබෙන මේ රමණීය දර්ශනය, ඕනෑම රසකාමියෙකුට කාව්‍යාත්මක හැඟීම් ඇතිකරගැනීමට අනුබල දෙයි. අපි ධර්මදාස වල්පොල "සුරංගනී" චිත්‍රපටියට ගැයූ "කඳුකරයේ ශාන්ත සන්ධ්‍යාවේ සොබා සිරියා" යන ගීය එකට ගයන්නට වීමු. "මේ සන්ධ්‍යාව නොවෙයි යකෝ, උදේ කඳුකරයේ ශාන්ත හිමිදිරියේ කියා කියාපල්ලා" යැයි රොමා වෙරිමතින් බෙරිහන් දුන්නේය. එතැන් සිට අපි, "කඳුකරයේ ශාන්ත හිමිදිරියේ" යැයි ඒ ගීය ගැයීමු.

එක් තැනෙකදී ශ්‍රී පාද කන්ද ලස්සනට පෙනෙන්නට විය. හැමදෙනාම, "සිරිපාදෙහි මේ දෙයියන්ගෙ රටේ මේ ශාන්ත උදේ සුගෙවීංදේ" යි ගයන්නට වීමු. එය නම් අවස්ථාවටම ගැලපෙන ගීයකි.

මෙසේ ඒ මනරම් දර්ශන නරඹමින්ද, ගී ගයමින්ද, ඉතිරි ආහාරපාන හා බෝතල් අන්තයටම ඉවරකරමින්ද, උදෑසන හය පමණ වනවිට අපි බදුල්ලට පැමිණියෙමු. මුළු රාත්‍රියම නිදිවර්ජිතව සිටියද කිසිවෙකුටත් නිදිමතක් හෝ වෙහෙස ගතියක් හෝ නොවිය. විස්සක් පමණ වූ අප පිරිස ගමන් මලු ආදිය කරේ එල්ලාගෙන පාරේ යනවිට, ඒ වේලාවේ පාරේ ගමන් කළ ටික දෙනා පවා අප දෙස විස්මයෙන් බලා සිටියහ. ඒ අප කෑකෝ ගසමින් පාරේ ගමන් කළ නිසාය. මේ වේලාවේ බදුල්ලේ කඩසාප්පු සියල්ලම වසා තිබූ හෙයින් අපට තේ කෝප්පයක්වත් බීමට 'තැනක් නැතැයි කියමින් රොමා මැසිවිලි නගන්නට විය. "තේ නෙවෙයි යකෝ, බලාපන් බාර් එකක් ඇරලද කියල අපට බෝතලයක් ගන්ට" යයි විතාරණ ඔහුට කීය.

අප බදුල්ලේ පාලම අසලට පැමිණෙත්ම එතැන "මාතර සැලූන්" යනුවෙන් බෝඩ් එකක් එල්ලූ බාබර් සාප්පුවක් විය. එය වසා තිබුණේය. එහෙත් එය දුටු විතාරණ මහ හඬින්, "බලාපල්ලා, කොහේ ගියත් මාතර එකෙක් කඩයක් හරි, හෝටලයක් හරි, බාබර් සාප්පුවක් හරි දාලා ඇති. හෙට අනිද්දා මාතර උන් හඳටත් ගිහිං එහේ හෝටල් දානවා නැද්ද කියා බලපල්ලා" යැයි අපට උජාරුවෙන් කිවූ විතාරණ උස් හඬින් "කපාපන් මල්ලී, මුන්ගේ බෙල්ලත් එක්ක. මමත් මාතර. මම එන්නං උඹේ සපෝට් එකට" යැයි කෑගසන්නට විය.

ඔයින් මෙයින් අපි හිඳගොඩ ජයසේකරගේ නිවසට පැමිණියෙමු. ඒ හිමිදිරි උදයේ අම්මාගේ මිනිය ළඟ වූයේ ජයසේකරත්, ඔහුගේ සහෝදරියනුත් පමණය. අපි දේහයට ආචාර කර එකත්පස්ව හිඳගතිමු.

ජයසේකරගේ අක්කා අපට තේ ගෙනාවාය. එය කොළඹ පලාතේ ඇති ජරා තේ වගේ නොව, බදුල්ලේ එළකිරි යොදා හැනූ රසවත් තේ ය. අපි කාලයකින් එළකිරිවල රසය විඳ ගතිමු.

ජයසේකර ටිකවේලාවකින් තවත් මිනිසෙකු කැටුව එළියට ගියේය. "මම ඉක්මනට එනවා. උඹලා ඔය බාත්රූම් එකෙන් හරි ළිඳෙන් හරි මූණ කට හෝදා ගෙන හිටපල්ලා" යනුවෙන් ඔහු අපට කියා ගියේය. ටික වේලාවකින් ඔහු ආපසු පැමිණියේ පාන් ගොඩක් රැගෙනය. ඒවා පෙති ගසා අසල්වාසීන් ලවා පිළියෙල කැර තිබූ අල හොදි, පරිප්පු, හාල් මැස්සන් හොදි හා සීනි සම්බෝල සමග හොඳ හැටි සප්පායම් වන්නට සැලැස්සුවේය. අපි බඩපුරා කා යළිත් එළකිරි තේ පානය කළෙමු.

මේ අවමංගල්‍යය සඳහා මල්වඩමක් රැගෙන යාමට මහ බැංකු සේවක සංගමය මට රු.30/-ක් දී තිබුණේය. එකල හොඳ මල්වඩමක් රු.20/-කට හෝ රු.25/-කට ගත හැකිව තිබිණි. සේවක සංගමය අවමගුල් සඳහා මෙසේ කිරීම එකල සිරිත විය. දැනුදු එය එසේ දැයි නොදනිමි. කෙසේ හෝ මල්වඩමක් මිලදී ගැනීමට මට අවකාශයක් නොවූයෙන් ඒ බැවි කියා අවමංගල්‍යයේදී හාමුදුරුවන් සඳහා වන පිරිකරට ගන්ටය කියා ඒ මුදල මම ජයසේකරට දුන්නෙමි.

ජයසේකර එය ප්‍රතික්ෂේප කළේය. "පිස්සුද බං. ඔය ඕනෑ තරම්

මල්වඩම ගෙනැත් තියෙන්නෙ. පිරිකරත් අපි අරන් ඉවරයි. ඕක උඹල බෝතලයකට තියාගනිං" කියා ඒ මුදල මට ආපසු දුන්නේය. මම ඔහුට තවත් ඇවිටිලි නොකළෙමි.

අවමගුල් ගෙදර බොහෝවේලාවක් ගත කල අපි, දවල් බතද එහිදී සප්පායම්ව, සවස 2.00ට පමණ දුම්රිය පොල බලා ආවෙමු. ඒ සවස 3.00ට කොළඹ බලා පිටත්වන දුම්රිය අල්ලා ගැනීමටය. ඒ එන අතරමගදීද බාර් එකකින් බෝතල් කීපයකුත්, සයිවර් කඩයකින් කටගැස්මත් මිලදී ගතිමු. අප ආපසු ආවේ දෙවැනි පංතියේ මැදිරියක වූ නමුත් එය මිනිස්සුගෙන් පිරී ගියේය. එහෙත් මැදිරියේ ඒ කොටසේ බහුතරය වූයේ අප පිරිසයි.

දුම්රිය පිටත්වනවාත් සමග පිරිසේ කෑම බීම ආරම්භ විය. කෑමට වඩා තිබුනේ බීමය. ගතවූ රාත්‍රියේදී මෙන් නොව මේ බී ගැසීම බොහෝ ඝෝෂාකාරී විය.

දුම්රිය ස්ථාන ගණනාවක් පසුකරත්ම, අප ගෙනා සියලුම බෝතල් අවසන් විය. පිරිසට හිතට හරි නැත. "කොහොම හරි තව බෝතල් දෙකක්වත් ගන්ට ඕනෑ" යි විතාරණ කියා සිටියේය. "ඉන්ඩකෝ, මම බලන්නම්" යි රොමා කීය. ඒ වේලාවේ ජයසේකර ගැනීම ප්‍රතික්ෂේප කල රු.30/- රොමාට දුනිමි. එය අතට ගෙන සිනාසුන ඔහු, "බෝතල් දෙකක් නෙමේ, තුනක්ම ගතෑකි" කියා විතාරණට කීය.

ටික වේලාවකින් අපේ දුම්රිය එක් ලොකු දුම්රිය පොලක නතර කැරිනි. මෙහි නම මට නිච්චි නැත. රොමා කලබලයෙන් ගාඩ්ව සොයා ගියේය. "අනේ ගාඩ් මහත්තයා, අපේ කණ්ඩායමේ එක්කෙනෙකුට හරි අමාරුයි. මම අර පේන කඩෙන් ඩිස්ප්‍රින් පෙති දෙකක් ගේන්ට යන්ට දැයි ඔහු ගාඩ්ගෙන් ඇසීය. ගාඩ් 'හා' කීවෙත් රොමා ස්ටේෂම මැදින් ඊයක වේගයෙන් කඩමණ්ඩිය දෙසට දිව ගියේය.

දුම්රියට මගීන් නැග, බැස අවසන් වී ඇති නිසා ඊට පිටත්වන්නට සංඥාව දෙමින් ස්ථානාධිපති නළාව පිම්බේය. එහෙත් ගාඩ් නළාව පිඹ කොඩිය වැනුවේ නැත. ඒ ඩිස්ප්‍රින් ගෙනෙන්නට ගිය රොමා තවමත් ආපසු නොආ නිසාය. අපි සියල්ලෝම කුතුහලයෙන් බලා සිටියෙමු. ගාඩ්ද ස්ථානාධිපතිද වේදිකාවේ හිටගෙන බලා උන්හ. දුම්රියේ මගීහුද කවුළුවලින් හිස් එළියට දමාගෙන ප්‍රමාදයට හේතුව විපරම් කරන්නට වූහ. මෙසේ විනාඩියක් දෙකක් ගතවූ පසුව රොමා දුම්රිය වෙතට දුවගෙන එනු පෙනිණි. අපි සැනසුම් සුසුම් හෙළුවෙමු. රොමාගේ දෑතේ අරක්කු බෝතල දෙකක්ද, කිහිල්ලේ එක් බෝතලයක්ද විය. එය දුටු ගාඩ් හිසේ අත ගසා ගත්තේය. අනතුරුව නළාව පිඹ කොඩිය වනා දුම්රියට පිටත්වන්නට සංඥා කළේය.

රොමාගේ වීරක්‍රියාව ගැනද නැණට සුදුසු නුවණ ගැනද අපි සියල්ලෝම ඔහුට ප්‍රශංසා කළෙමු. ගමනේ ඉතිරි කොටස පිරිමසා ගැනීමට ඒ බෝතල් තුන හොඳටම සෑහුණේය.

තවත් එක්තරා දුම්රිය පොලකින් අපේ මැදිරියට මිනිස්සු තුන්දෙනෙක් ගොඩවූහ. ආසන අතර බිම ඇණ තියාගෙන වාඩිවූ ඔව්හු සනකම් කොළයක එතූ මුලක් බිම තබා දිග හැරියහ. එහි වූයේ තුනී වීදුරු කවුය. එකෙක් ඒවා ටිකක් ගෙන කටේ දමා සපන්නට විය. මගීන් සියලුදෙනාම ඒ දෙස මවිතයෙන් බලාඋන්හ.

විතාරණ මෙවිට ඉංග්‍රීසියෙන් අපට අනතුරු ඇඟෙව්වේය. "ඒයි උඹලගේ රාක්ක උඩ තියෙන බෑග් බලාගනිල්ලා. මුන් එන්නේ මෙහෙම මැජික් පෙන්නලා අපි ඒ දිහා බලාගෙන ඉද්දී අපේ බෑග් අරගෙන පනින්ටයි" ඔහු කීය. ඒ ඇසූ අපි වීදුරුකවූ සැපීම බලා සිටීම පසෙකලා රාක්ක මත තිබූ අපේ බෑග් දෙස ඇස ගසාගෙන සිටියෙමු.

විතාරණ කීවේ ඇත්තකි. එදින ඉරිදා දවසක් වූයෙන්, කොළඹ රැකියාව කරන බොහෝදෙනා ගමට ගොස් ආපසු කොළඹ යන්නේ මේ දුම්රියේය. ඔවුන්ගේ ගමන් මලු හා හා දෙයින් පිරී තිබිණි. එය මේ පික්පොකට්කාරයෝ හොඳාකාරව දනිති. ඒවා සොරාගෙන යෑමේ එක් උපක්‍රමයක් නම් මෙසේ මැජික් පෙන්වා මගීන්ගේ අවධානය එයට යොමුවී පවතින අතරතුර, ඔවුන්ගෙන් අයෙකු බෑග් සොරකම් කිරීමය. විතාරණගේ කථාව නිසා අප ඔවුන් දෙස යලිත් බැලුවේවත්, ඔවුන්ට මුදල් දුන්නේවත් නැත. කෙසේවුවද මාතර ගමක ඉපදී එහිම හැදී වැඩී මුහුකුරා ගිය විතාරණ වැන්නවුන් තම්බන්නට මේ කොළඹ පලාතේ අයියලාගේ ප්‍රඥාත් ගොරකත් සෑහෙන්නේ නැත! අපි මෙසේ කියා විතාරණට ප්‍රශංසා කළෙමු.

ආපසු ගමනේදී, පොල්ගහවෙලින් රොමා බැස ගියේය. එයින් පසුව අප පිරිසේ උද්යෝගය භාගයකින්ම අඩුවිය.

ඉනික්බිතිව අපි ගමනාන්තය දක්වාම සුවසේ පැමිණියෙමු.

මාගේ හතළිස් අවුරුදු රාජකාරි කාලයේදී සිදුවූ එක් රසවත් සිද්ධියක් කෙටිකර ලියා මෙසේ ඔබ වෙත ඉදිරිපත් කරමි. දැනට වසර කීපයකට පෙර මෙහි නම සඳහන් අප හිතවතෙකු මෙන්ම විනෝද කාමියෙකු වූ ධර්මසිරි විතාරණ සහෘදයාද C.B. ජයසේකරද අප අතරින් සදහටම වියෝවූහ. මම ඔවුන්ට නිවන් සුව පතමි.

මේ කථාවේ සෙසු පාත්‍ර වර්ගයා තවම අප අතර සුවසේ සිටිති. ඔවුන් මේ සිද්ධිය කියවා අතීතය සිහිකර රසවිඳිනු නොඅනුමානය.

P.W. ප්‍රනාන්දු

# ව්‍යසනාවට ආයු කෙටියි

මා එකල පදිංචිව සිටියේ, පුංචි බොරැල්ලේ අංක 41, ෆ්‍රැන්සිස් මාවතෙහිය. එය ද සොයිසා වාට්ටුවේ තාප්පයට අල්ලා පිහිටියේය. එහි උඩ තට්ටුවේ සිට නර්ස් නෝනලාට මා කථා කරන්නේ හස්ත සංඥාවෙනි. මම ඔවුන් එකියක සමග නොව, දන්නා හැමදෙනාක සමගම මිතුරුව සිටියෙමි. ඒ තනිකර එකියක සමග මිතුරුව සිටිනවාට වඩා හොඳ බැවිනි.

පෙරදින කථා කරගත් පරිදි, ද සොයිසා වාට්ටුවේ සහ මහා රෝගශාලාවේ නර්ස් නෝනලා කැලක්ද, පෙම්වතුන් ජෝඩු දෙකක්ද සමග තනිකඩ මමද දෙහිවල සත්ව උද්‍යානය නැරඹීමේ ගමනට සහභාගි වීමු. අවසානයේ සිංහයන්, ව්‍යාඝ්‍රයන්, වගවලසුන් කොටින් සිටින පොළෝ තලයේ ගුහාවන් අසබඩට අපි පැමිණියෙමු. ගතවූයේ මොහොතකි. "සිංහ ධේනුවක් පැන්නා" යයි මහ හඬක් ඇසින. ආරක්ෂකයෝ තුවක්කු රැගෙන ක්ෂණයකින් තැන තැන රැකවල් ලා ගත්හ. සියල්ලෝ හිස් ලූ ලූ තැන දුවන්ට පටන් ගත්හ. සිදුවූයේ කුමක්ද? එතැන් සිට මම කිසිවක් නොදන්නෙමි.

මා අසල සිටි නර්ස් නෝනලා සියල්ලෝ ආරක්ෂාව පතා මාව බදාගෙන තද කරගත්හ. මගේ උඩුකය සනීපදායක කොට්ට සමූහයකින් තෙරපන්නාක් මෙන් මට දැනුණි. එකියක මාගේ මුහුණට මුහුණ තබාගෙන ගැහෙමින් මාව බදාගත් වනම සිටියාය. හරියට පැස්බරා ආරක්ෂාවට වැල්ලේ හිස සඟවන්නාක් මෙනි. හැම පැත්තෙන්ම ආරක්ෂිත වූ මට නම් කිසිදු බියක් ගෙන නොදුනි. "සිංහ ධේනුව ගුහාවට පැන්නා" යයි ඇසෙන විට විනාඩි 10ක් පමණ ගතව ගොස්ය. නර්ස් නෝනලා දිග හුස්මක් ගෙන එකිනෙකා මාව අතහරින්නට වූහ. පෝරණුවකින් ගොඩගත්තෙකු මෙන් මගේ සිරුර එවිට මුළුමනින්ම තෙත්වී තිබිණ. පසුව අතැති ලේන්සු වලින් ඔවුහු මට පවන් සලන්නට වූහ.

පසුදින පොල් අකුරින් "සිංහ ධේනුව ගුහාවෙන් පනී" යනුවෙන් පළව තිබිණ. සිංහ ධේනුවට ගල් කැටයකින් ගසන ලද තරුණයාම ක්ෂණයකින් අල්ලා ඔහුගේ කකුල සපා කා තිබිණැයි පුවත්පත්වල පළව තිබිණ.

ඒ.මු. සෙනෙවිරත්න

---

## අප අතරින් වියෝවූවන්

1. ඒ.එස්. මුල්කිරිගම මිය (48)
2. කේ.ඒ.ඩී.පී. කාරියප්පෙරුම (547)
3. එඩ්මන්ඩ් වීරසිංහ (440)
4. කේ.ඩී.ටී. සුසානා ඩයස් මිය (26)
5. ඊ.එල්. කොරයා (287)
6. බී.ජී. කරුණාසේන (3318)
7. කේ.ඇම්.ජේ. පෙරේරා
8. පියතිස්ස ඒකනායක (3263)
9. ඩී.බී. සමරදිවාකර
10. වී.ඩබ්ලිව් ජයතිලක බණ්ඩා (7927)
11. මිල්රෝයි රණසිංහ (589)
12. ඩබ්ලිව් ඒ. අමිතලතා මෙය (338)
13. ජී.ඩී. ධර්මසේන (393)

## Obituaries

1. Mrs. A.S. Mulkirigama (48)
2. K.A.D.P. Kariyapperuma (547)
3. Edmond Weerasinghe (440)
4. K.D.T. Susana Dias (26)
5. E.L. Correa (287)
6. B.G. Karunasena (3318)
7. K.M.J. Perera
8. Piyathissa Ekanayake (3263)
9. D.B. Samaradivakara
10. V.W. Jaythilake Banda (7927)
11. Milroy Ranasinghe (589)
12. Miss. W.A. Amithalatha (338)
13. G.D. Dharmasena (393)

# පැනෝරාමා හෝටලය - කළුතර එක්දින චාරිකාව 2011 සැප්. 17

චාරිකාවකැ'යි කියූ කල චමත්කාර ජනක සිතුවිලි වලින් අප සිත් පිරී යයි. එය ඒකාකාර ජීවන රටාවෙන් බැහැරව සොබාදහමේ සුන්දරත්වය නරඹන්නක් හෝ, බැතිබර හැඟීමෙන් යන වන්දනා ගමනක් හෝ මිනිසාගේ අද්භූත නිර්මාණයන් දක බලා ගැනීමක් හෝ විය හැකි බැවිනි. එහෙත් මහ බැංකු විශ්‍රාමිකයින්ගේ චාරිකාවක් යනු හැමදා දකින හැමෝම එක්ව යන හුදු චාරිකාවක් පමණක් නොවේ. දිගු කලක්, එකම වහලක් යට හමුවූ ඔවුහු දන් තම පැරණි හිතමිතුරු මිතුරියන්ගෙන් ඈත්ව හුදකලාව ජීවත්වන්නාහුය. එහෙයින් ඔවුනට චාරිකාවක් වැදගත් වනුයේ, පැරණි හිත මිතුරු මිතුරියන්ගේ සුහද හමුවක් වශයෙනි.

2011, සැප්. 17 දින පෙ.ව. 7.30 ට පමණ සර්ව දිග් භාගයෙන් පැමිණි හිත මිතුරෝ, මහ බැංකු රථ ගාලේදී එක් බසයකටද, බම්බලපිටිය දුම්රියපොල ආසන්නයේදී තවත් බසයකටද, නුගේගොඩ Pizzahut ආසන්නයේදී තවත් බසයකටද නැග ගත්හ. නුගේගොඩින් පිටත් වූ බසය හයිලෙවල් පාර, කොට්ටාව, පිළියන්දල මොරටුපාර ඔස්සේද, අනිකුත් බස් රථ දෙක ගාලු පාර ඔස්සේද කළුතර බලා ගමන් ඇරඹීය.

පෙ.ව. 7.30 ට පමණ නියමිත වේලාවට නුගේගොඩ Pizzahut ආසන්නයට මමද පැමිණියෙමි. ඒ වනවිටත් 15 දෙනෙකුගෙන් පමණ සමන්විත අප සාමාජික පිරිසත් එහි පැමිණ සිටියහ. එතැන ඔවුනොවුන්ගේ අල්ලාප සල්ලාපයෙන් ඇතොර විය. සිනාමුසු මුවින් ඔවුහු තම මිතුරු මිතුරියන්ගේ වගතුග විචාරන්නට වූහ. මා දුටු අයෙක් හලෝ.......... යයි මා අමතා අතට අත දුන්න. මමද හලෝ විලී, ර.මු., අල්විස් මල්ලී, පියේ (ගජසිරි), ජයේ, රූපා, කුමාරි යනුවෙන් ඔවුන් අමතා අතට අතදී පිළිවදන් දුනිමි. මහ බැංකුවේදී අහිගයින් සහෘදයින් වූ ඔවුන් දකීම මට අත්‍යානන්දජනක හැඟීම් දනවන්නක් විය. මා මෙම චාරිකාවට සහභාගී නොවීනම්, ඔවුන් කවදා හමුවේද'යි සිතිය නොහැකිය.

බස් රථයේ ගමන ගත්තවුන්ගෙන් කිහිප දෙනෙක් කොක් සරක් මෙන් දික් වූ ගෙලෙන් යුතුව අප සගයින් බසයට නගින්නා වූ සන්ධිස්ථාන පිරික්සමින් ගමන් ගත්හ. මහරගමදී අප ගමනට එඩි සහ කමල් එක්වූහ. කොට්ටාව මංසන්ධිය පසුකරද්දී "හරි ජොලී, කොස්තාස් ඉන්නවා යැ"යි එකෙක් කීය. කොස්තා මා ඇසුරුකොට නැතත්, ඔහු විනෝද ගමන් බිමන් යෑමේදී වඩාත් ප්‍රියජනක පුද්ගලයෙකු වී යැයි මට සිතිණ. රූපානන්ද නැති ට්‍රිප් එකක් නැතැයි කියූ එකෙක්, අතට අතදී ඔහුව පිළිගත්තේය. තවත් කිහිප දෙනෙක්ම බසයට නගින්නට වූහ. පිළියන්දල මංසන්ධිය පසුකරත්ම අප සොයුරියන් හේමා, තිලකා යනුවෙන් කෑ ගසන්නට විය. ඒ ඔවුන් බසය දෙස නොව වෙනතක් බලා සිටි නිසායැ'යි හැඟිණ. ඔවුන් දෙදෙනාද බසයට නැංගහ. මොරටුව පසුකරත්ම සවිත්‍රි, කිලෝ 50ක්, පමණ බරති කඩියක් ගෙනැවිත් බලා සිටියාය. "ඇව්ඩ් එය ර.මු. ට දෙන්නට තිබා යැ"යි ඇය කීය. ර.මු. ත් තව දෙදෙනෙකුත් බසයෙන් බැස අතක් තරම් විශාල කඩිය ඉතා අමාරුවෙන් බසයට ඇද දමූහ.



වෙරළ තීරය දිගේ ආ බස් දෙකත්, අප පැමිණි බසයත් පෙ.ව. 10.30 ට පමණ පැනෝරමා හෝටලයට ලඟාවිය. හෝටලයට පිවිසි සැනින්ම අපට එය "පැනෝරමාවක්"ම යැයි සිතිණ. සර්ව දිසා පරයන ලක්ෂණ එහි විය. එනම් හාත්පස පැහැදිලිව පෙනෙන ස්ථානයකි එය. එක් පැත්තකින් කළු ගං තෙරද, අනිත් පැත්තකින් ජලාශයක්ද, තවත් පැත්තකින් නිල්වන් පොල්වතු යායක්ද විය. ඊට නුදුරින් කළුතර බෝ සම්බුද්ධ පෙනිණ. එතැන් සිට තවත් බොහෝ දේ නැරඹිය හැකි යැයි සිතේ. මනහර භූමි පෙදෙස. සුරම්‍ය ලෝකයේ

වණ්ඩත්වය පහ කරන ආවරණ බඳු රුක්ෂ සමූහයාගෙන් යුතු විය. එහි තැන් තැන් වල පුටු හා මේස සමූහයා, පිළිවෙලකට තබා තිබිණ. ශාලාභ්‍යන්තරයෙහි ලැගුම් ගන්නවුන් සඳහා මනාව පිළියෙල කරන ලද පුටු හා මේස සමූහයා විය. අප සියල්ල පිළිගැනීමට ජීවී අජීවී සියල්ල සූදානමින් සිටින්නාක් මෙන් දිස් විය.

බොහෝ අය අනෙකුත් බස්වලින් පැමිණි අය කවුරුන්දැ'යි නොදන සිටියහ. ටික වේලාවක් යනතුරුම ඔවුනොවුන් වැළඳගැනීම්, අතට අත දීම හා සුවදුක් විචාරීම් ආදියෙන් ඈතොර විය. සිසිල් පැන් සමඟ කේක් ආදිය ගැනීමෙන් පසු සියල්ලෝ ශාලාග්‍රිකව හෝ එළිමහන් තැන්වල රිසිසේ, තම හිත මිතුරන් හා එක්ව අසුන් ගත්හ. මහා සභාවකට වඩා තැන් තැන් වල කුඩා කුඩා සභා එහි විය. අප සමඟ ගමන් ගත් බසයක පැමිණි සංගීත කණ්ඩායම වාද්‍ය භාණ්ඩ හා එක්ව ගී ගයන්නට වූ අතර සංගීත රාවය අතරේ හැමදේම සිදුවිය. සහෘදයන් සමඟ එක්ව මත්පැන් බීම, අප චාරිකාවල විශේෂාංගයක් වුවද, ඉන් කිසිවෙක් මත් නොවූහ. පැරණි විනෝදාත්මක කථා කීමෙන් හා ඇසීමෙන් ඔවුන් කුල්මත්වූ බැව් නම් සැබවි. එකෙකු කියූ කථාවක් වඩාත් සිත් ගන්නා සුළු විය. එක්තරා රංග ශාලාවක නාට්‍යය රඟ දක්වීමට ඕන්න මෙන්න කියා තිබියදී ජාතික ඇඳුම ඇඳි මහතෙක් තිරය අසබඩට වී, මිතුරෙකු සමඟ සංවාදශීලිව සිටියේය. නළුවන් අතර ප්‍රධාන චරිතයක් ගෙන සිටියේ, අප මහ බැංකුවේම මිතුරෙකි. එහෙයින් නරඹන්නන් අතර මහ බැංකුවේ සහභාගිත්වයද ඉහලින් තිබිණ. මේ අතර ජාතික ඇඳුම හැඳි මිත්‍රයා සතුටු සාමිචියෙහි යෙදී සිටියදී, එක්තරා මිත්‍රයෙක්, ඔහුගේ සරමේ පොටක්, තිර රෙද්දට අල්ලා අල්පෙනෙත්තක් ගැසීය. නාට්‍යය රඟපෑමට ආසන්නව තිරය උඩට ඇදීමේ සංඥාව නිකුත් කරනවාත් සමඟම තිර රෙද්ද ක්‍රමයෙන් උඩට ඇදී යන්නට විය. අප මිත්‍රයාගේ සරමද ඒ සමඟම උඩ යන්නට පටන් ගත්තේය. සිදුවූයේ කුමක්දැයි නොදන සිටි මිත්‍රයා "හා හා මොකක්ද මේ. මගේ සරම" යැයි කෑ ගසන්නට විය. නාට්‍යයේ මුල් ජවනිකාව මෙසේ ආරම්භ විය. මුළු සභාගැබම සිනාසෙන්නට වූහ. මේ මා අසුන්ගෙන සිටි කාණ්ඩයේ, මිත්‍රයෙකු කියූ එක් රසවත් කථාවක් පමණි.

ක්‍රීඩා

1) කඹ ඇදීම.

2) දෙහි ගෙඩිය හැන්ද මත තබා දිවීම.

3) යෝගට් තරගයට කෑම.

4) බැලුන් තරගයට පිම්බීම.

5) සංගීත පුටු තරගය.

6) තෑගි පාර්සලය අතිනත යැවීම.

7) නූලක එල්ලන ලද බට්ටු ගෙඩිය කින් දෙහි ගෙඩියට දමා ගැසීම ආදියයි.



මෙහි අන්තිමට සඳහන් ක්‍රීඩාව මා දුටුවේ පළමු වරටය. මෙය කාගේත් සිත් ගන්නාවූ ක්‍රීඩාවක් විය. මේ හැම ක්‍රීඩාවකින්ම මහලු වියට පත්ව සිටි අප හැම සුන්දර වූ ළමා වියට පිවිසවන්නාක් මෙන් මට දැනිණ. විවිධ ක්‍රීඩාදිය නැරඹීමෙන් හා සහභාගීත්වයෙන් අපි සාමාන්‍ය ජීවිතයේ ලද නොහැකි අපරිමිත තෘප්තියකට පත්වීමු. මේ අතර සාමාන්‍ය ක්‍රීඩාදියෙන් තොර විශේෂාංග රැසක්ද විය. එනම්, වඩාත් ජනප්‍රිය කාන්තාව තේරීමේ තරග වැනි ඒවාය. මර්ලින් ජයසූරිය මිය ජනප්‍රිය කාන්තාව බවට තේරුණි. ඇය සැබැවින්ම ජනප්‍රිය කාන්තාවකි. දිවා ආහාර භෝජනය ඉන්පසු උදාවිය. ඒ සඳහා පැය භාගයක පමණ විවේක කාලයක් ගතකිරීමට සිදුවිය. පසුව එළඹියේ සංගීත ප්‍රසංගයයි. එහි නිවේදකයන් වශයෙන් ධර්මසේන වැලිගම, ඩී.ආර්. දයාවංශ, ෆුල්ජිනා මුණසිංහ මිය කටයුතු කළහ. නිමල් කුරේ, ධර්මසේන වැලිගම, ඩී.ආර්. දයාවංශ සහ කමල් ආදීහු ගී ගැයූහ. ඔවුහු ඒක පුද්ගල ගායනා හා සමූහ ගායනාවලින් නරඹන්නන් කුල්මත් කළහ. අසලින් ගලායන කළු ගංගා නදියට ඇසෙනා සේ මහ හඬින් "පිනාමුකෝ කළු ගඟේ" ගීතය ගයමින් හැමෝම ප්‍රීති වූහ. සංගීතයට නැකම් කියන රිද්මයානුකූල චලනයන්ද එහි විය. දොන් චන්ද්‍රසේකර, පැට්නෙල්සන්, රෝසා ආදීහු ගායනයට එක'ව රිද්මයානුකූල චලනයෙන් සියල්ලන් මුසපත් කළහ. සවස තේ පානය දක්වා කාලය කෙමෙන් කෙමෙන් ළඟ විය. තේ පානයෙන් පසු විශේෂ කථා පෙළක් හා ස්තුති කථාවද විය. එම්.ඒ. පියදාස මහතා විසින් දීර්ඝ කථාවක්

කරන ලද අතර එදින චාරිකාව අතිශයින් සාර්ථක වූ එකක් බැව් ගේ පළ කළේය. මෙවැනි චාරිකා මගින් සියලු දෙනා හමුවීමේ දුර්ලභ අවස්ථාවක් ඇති කරලීමෙන් සංගමය විසින් කරනු ලබන සත්කාරය අතිශයින් ප්‍රශංසනීය බැව් ඔහු ප්‍රකාශ කළේය. අනාගතයේදී මීටත් වඩා සාර්ථක චාරිකාවක් සංවිධානය කරන මෙන් ඔහු සංගමයෙන් ඉල්ලා සිටියේය.

ඉන්පසු ගරු සභාපති තුමා විසින් සිය ස්තුති කථාව කරන ලදී. සහභාගී වූ සියලු දෙනාටත්, විවිධාකාරයෙන් කරගාදිය සංවිධානය, විනිශ්චය කරන ලද අයවත් ගරු සභාපති තුමා විසින් සිය ස්තුතිය පුද කරන ලදී. එතුමාගේ කථාවේ විශේෂයෙන් සඳහන් කරන ලද කරුණක් වූයේ විශ්‍රාමිකයින් වන අපගේ නොවිසඳී ඇති ප්‍රශ්න සියල්ල විසඳාලීමට සිය ශ්‍රමය හා කාලය වැඩිමහත්ව කැපකරනු ලබන බවයි.

හිරු අවරට බැසයත්ම, පැනෝරමා හෝටලයද අපට හැර දමා යාමට සිදුවිය. සියල්ලෝ ඉමහත් සතුටින් පිරී ගියහ. තම තමන් නැගී ආ බස් රථයට ඔවුන් ගොඩවූයේ තවත් චාරිකාවක් සිත්හි සනිටුහන් කරගෙනය. එය බහු දින චාරිකාවකි. තවමත් එහි දිනය තීරණය නොකළ නැතැයි සිතමි. අපගේ සන්නිවේදන මාධ්‍යයන් වනුයේ, චාරිකාවන් හා මෙම "සෑදෑව" සඟරාවයි. විශ්‍රාම යෑමේදී විශ්‍රාමිකයින් වන ඔබ වැඩිදෙනෙකු මා දන සිටියේ නැත. චාරිකාවලට සහභාගී වීමෙන් ඔබ වැඩිදෙනෙකු හැඳිනගැනීමටත් ඇසුරු කිරීමටත් මට හැකිවිය. එසේ නොවීනම් මා පැරණි මිතුරන් කිහිපදෙනෙකු පමණක් ඇසුරු කරන හුදකලා පුද්ගලයෙකු වනු ඇත. අප සංගමයේ චාරිකාවන් සඳහා ඔබ හැම එක්වේ" යනු මගේ පණිවිඩයයි.

චාරිකා අගයන සාමාජිකයෙක්

> "සෑදෑව" සඟරාව පලකිරීමේ ප්‍රමාදය ගැන අපගේ කණගාටුව පලකරමු. සඟරාවේ ප්‍රධාන සංස්කාරක හේමසිරි ප්‍රනාන්දු මහතා රෝගාතුරව මසක් පමණ කලක් ආරෝග්‍යශාලා ගතව සිටියේය. ඔහු දැන් සුවය ලබා විවේක සුවයෙන් සිටී.


# සෑදෑව

විශ්‍රාමිකයන්ගේ අඩවිය

මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2011 ඔක්තෝබර්

වෙබ් අඩවිය : www.sendewa.com org විද්‍යුත් ලිපිනය : info@cbpa.com

අංක QD/118/News/2010 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.




Mr. Miktham Thaha
Creative Fast
36/3 B1, IDH Road
Salamulla
Kolonnawa

ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමය විසින් නිකුත් කරන ලදී.

01

# විශ්‍රාම වැටුප් විෂමතාවය යනු කුමක්ද? විමසා බැලීමක්

ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාම වැටුප් ක්‍රමයේ ආරම්භය 1957 ජනවාරි 01 දා තරම් ඈත අතීතයක් කරා දිව යයි. එහෙත් මාසික විශ්‍රාම වැටුප් ක්‍රමය ආරම්භ වූයේ 1965 ජනවාරි 01 දිනයි. එය වරින් වර විවිධ වෙනස් කම් වලට භාජනය වෙමින් 1997 දෙසැම්බර් 31 දිනෙන් ඇවර විය. මෙම වෙනස්කම් වලින් ප්‍රධාන වෙනස්කම් 2ක් පමණක් ඉහත මාතෘකාවට අදාල බැවින් ඒ පිළිබඳව විමසා බලමු

01. විශ්‍රාම වැටුපේ ප්‍රමාණය තීරණය කල යුතු ආකාරය පිළිබඳ ඇතිවූ වෙනස්කම්.
02. විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් බැර කිරීම පිළිබඳ ඇතිවූ වෙනස්කම්.

<u>විශ්‍රාම වැටුපේ ප්‍රමාණයේ ඇතිවූ වෙනස්කම්</u>

ආරම්භක අවස්ථාවේදී විශ්‍රාම වැටුපේ ප්‍රමාණය ගණනය කරන ලද්දේ පහත සඳහන් ආකාරයටය.

01.

$$\frac{\text{සේවාවේ සම්පූර්ණ කළ මාස ගණන} + 60}{720} \times \text{අවසන් අවුරුදු තුනෙන් ලබා ගත් මාසික මූලික වැටුප් සාමාන්‍යය}$$

(විශ්‍රාම වැටුප, වැටුපෙන් 2/3 ක උපරිමයට යටත්ව)

02.

1974 ජූලි මස 16 වෙනි දින සිට එය පහත සඳහන් ආකාරයට වෙනස් විය.

$$\frac{\text{සේවාවේ සම්පූර්ණ කළ මාස ගණන} + 60}{720} \times \text{(අවසාන කල්පිත මූලික වැටුප් සාමාන්‍යය + ඒකාබද්ධ ජීවන වියදම් දීමනාව අදාල තැන්හිදී විවාහ දීමනාව)}$$

(විශ්‍රාම වැටුප, වැටුපෙන් 2/3 ක උපරිමයකට යටත්ව)

03. 1985 ජනවාරි 01 ක්‍රියාත්මක වන පරිදි මාසික විශ්‍රාම වැටුප ගණනය කරන ලද්දේ පහත සඳහන් ආකාරයටය. එනම් පහත සඳහන් ආකාරයට ගණනය කරන ලද විශ්‍රාම වැටුප ඊට පහතින් දී ඇති වක්‍රයේ අනුපාතයන්ට ගලපන ලදී.

i. අවසාන මාසයේ මූලික වැටුප.
ii. නිවාස කුලී දීමනාව.
iii. (මූලික වැටුප + නිවාස කුලී දීමනාව) × 10%
iv. රු.140 විශ්‍රාම දීමනාව.
v. රු.125 දීමනාව.
vi. අදාල තැන්හිදී විවාහ දීමනාව.

} මෙ සියල්ලේම එකතුව පහත සඳහන් අනුපාතයට ගලපන ලදී.

| වයස | | | | | |
|---|---|---|---|---|---|
| 55 | 56 | 57 | 58 | 59 | 60 |
| ප්‍රතිශතය | | | | | |
| 80 | 81 | 82 | 83 | 84 | 85 |

04. 1990 ඔක්තෝබර් 18 දින පටන් ක්‍රියාත්මක වන පරිදි නැවතත්, මාසික විශ්‍රාම වැටුපේ පදනම වෙනස් කරන ලදී. ඒ අනුව අවුරුදු 30ක සේවා කාලයක් සම්පූර්ණ කල සේවකයකුට ඉහත 1 සිට 6 දක්වා දක්වන ලද කොටස් වල එකතුවෙන් 90% ක විශ්‍රාම වැටුපක් ලබා දෙන ලදී.

05. අවසන් වරට විශ්‍රාම වැටුප සංශෝධනය වන්නේ 2003 ජනවාරි 01 දායි. එතැන් පටන් විශ්‍රාම වැටුප ගණනය කිරීම සඳහා පහත සඳහන් කොටස් වල එකතුව ලබා ගන්නා ලද අතර ඉන් 90% ක විශ්‍රාම වැටුපක් ලබා දෙන ලදී.

i. අවසන් මාසයේ මූලික වැටුප.
ii. ගෙවල් කුලී දීමනාව.
iii. (මූලික වැටුප + ගෙවල් කුලී දීමනාව) x 10%
iv. විශ්‍රාම වැටුපට අදාල කරගත යුතු යයි මූල්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම දීමනාවක්.

**විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරනු ලබන දායක දීමනා වල ඇතිවූ වෙනස්කම්.**

01. 1957 ජනවාරි 01 දා සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම වැටුප් අරමුදලක් පිහිටුවා ඇති අතර, ඒ සඳහා සෑම සේවකයකු ගේම මූලික මාසික වැටුපෙන් 10% කට සමාන මුදලක් එම සේවකයාගේ පත්වීමේ සිට අස්වීම දක්වා එම ගිණුමට ශ්‍රී ලංකා මහ බැංකු අරමුදල් වලින් බැර කළ යුතුය.
02. 1992 ජූලි 31 දින දක්වා ඇති වෙනස්කම් දක්වමින් නිකුත් කර ඇති මහ බැංකු අත්පොතට අනුව, විශ්‍රාම වැටුප් අරමුදලට බැර කළ යුතු ප්‍රතිශතය 45% දක්වා වැඩිකර ඇත. ඒ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට හිමිකම ඇති සියලුම සේවකන්ගේ මාසික දළ වැටුප් එකතුවෙන් 45% ලෙස දක්වා ඇත. තවද, විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අරමුදල් හිඟ වන ඕනෑම අවස්ථාවක අරමුදලට මුදල් බැර කිරීම සඳහා මුදල් මණ්ඩලය වෙත බලය පවරා ඇත.
03. 2009 ජූලි 01 දින දක්වා ඇති සියලුම සංශෝධන ඇතුලත් කරමින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා මහ බැංකු අත්පොත දක්වා සිටින්නේ, මුදල් මණ්ඩලය විසින් කලින් කලට නිශ්චය කරනු ලබන ප්‍රතිශතයකට අනුව විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම ඇති සියලුම සේවකයන්ගේ මාසික දල වැටුපෙන් ගණනය කරනු ලබන ප්‍රමාණයන් මාසිකව විශ්‍රාම වැටුප් අරමුදලට බැර කළ යුතු බවයි. තවද අරමුදලින් ගෙවීම් කිරීමට ප්‍රමාණවත් මුදලක් අරමුදලේ නොමැති ඕනෑම අවස්ථාවක ශ්‍රී ලංකා මහ බැංකු අරමුදල් වලින්, විශ්‍රාම වැටුප් අරමුදලට මුදල් බැර කිරීම සඳහා මුදල් මණ්ඩලය වෙත අවසර දී ඇත.
මෙසේ කලින් කලට විශ්‍රාම වැටුප් අරමුදලට එක් කරන ලද සංශෝධන වලට අනුව පෙනී යන්නේ, එකම ශ්‍රේණියක එකම වැටුප් තලයකින් සේවකයන් දෙදෙනෙකු වෙනස් අවුරුදු දෙකකදී විශ්‍රාම ගියහොත් ඔවුන් ගේ සියලුම වැටුප් අතර පරතරයක් තිබිය හැකි බවයි. මෙය විශ්‍රාම වැටුප් විෂමතාවයක් යනුවෙන් හඳුන්වනු ලැබේ.
කෙසේ වෙතත්, 1986 ජූලි 10 දිනැතිව ලේකම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද, විශ්‍රාම වැටුප් අරමුදල් අංක 6 දරණ චක්‍රලේඛණයට අනුව, 1985 ජනවාරි 01 දිනට ප්‍රථම විශ්‍රාම ගිය සේවා නියුක්තිකයන්ගේ විශ්‍රාම වැටුපද, 1985 ජනවාරි 01 දා සිට ක්‍රියාත්මක වනසේ ප්‍රතිශෝධනය කල යුතු බවට නියම කොට ඇත. මෙය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන්නට ඇතැයි සිතමු. එම නිසා, 1985 ජනවාරි 01 දා සිට ඊට පෙර තිබූ නිසාවූ විශ්‍රාම වැටුප් විෂමතාවයන් සියල්ල ඉවත් වන ලදී.
එහෙත්, නැවතත් 1990 ඔක්තෝබර් 18 දින හා 2003 ජනවාරි 01 දින සංශෝධනයන් 2ක් ඇති විය. මෙම සංශෝධන හේතුකොට ගෙන පහත සඳහන් විෂමතාවයන් ගොඩනැගී ඇත.

1. 1990 පෙර අය හා 1990 ට පසු එහෙත් 2003 පෙර විශ්‍රාම ගිය අය අතර.
2. 1990 ත් 2003 ත් අතර විශ්‍රාම ගිය අය හා 2003 ට පසු විශ්‍රාම ගිය අය අතර.
3. 1990 ට පෙර විශ්‍රාම ගිය අය හා 2003 ට පසු විශ්‍රාම ගිය අය අතර.

මේ විශ්‍රාම වැටුප් විෂමතාවයේ එක් පැත්තක් පමණි. විශමතාවයේ දරුණු කොටස ඇති වූයේ, අවුරුදු 03 කට වරක් ශ්‍රී ලංකා මහ බැංකුවේ වැටුප් වැඩි කිරීමට සමගාමීව සමාන අනුපාතයකින් විශ්‍රාම වැටුපද වැඩි නොකිරීම හේතුවෙනි. 1997 සිට 2009 දක්වා වැටුප් හා විශ්‍රාම වැටුප් වැඩි කල ආකාරය දක්වනසංඛ්‍යා සටහනක් පහත පල කරමු.

| ශ්‍රී ලංකා මහ බැංකු වැටුප් හා විශ්‍රාම වැටුප් වැඩි කිරීම | | | | |
|---|---|---|---|---|
| | අභ්‍යන්තර සේවක | | විශ්‍රාමික | |
| | පහල ශ්‍රේණි | ඉහල ශ්‍රේණි | 1980 ට පෙර | 1980 ට පසු |
| 1997 | 43% | 18% | 15% | 10% |
| 2000 | 33% | 33% | 15% | 10% |
| 2003 | 58% | 46% | 20% | 20% |
| | | | (1991 පෙර) | (1991 ට පසු) |
| 2006 | 47% | 65% | 12.5% | 5% |
| | | | (2000 ට පෙර) | (2000 ට පසු) |
| 2009 | 38% | 39% | 15% | 5% |

ඉහත සංඛ්‍යා සටහනට අනුව පෙනී යන්නේ, සේවක වැටුප් වැඩිවීමට සාපේක්ෂව විශ්‍රාම වැටුප් වැඩිවීම ඉතාමත් අල්ප බවයි. එය දෙකෙන් පංගුවකටත් වඩා අඩුය. මෑත වර්ෂවල එනම්, 2006, 2009 වසර වල ඉතිහාසයේ අඩුම විශ්‍රාම වැටුප වැඩිවීම වාර්ථා කරයි. මෙම තත්වය යටතේ මෑත වර්ෂවල විශ්‍රාම යන අයගේ විශ්‍රාම වැටුප වැඩිවීම වාර්තා කරයි. මෙම තත්වය යටතේ මෑත වර්ෂවල විශ්‍රාම යන අයගේ විශ්‍රාම වැටුපට වඩා බොහෝ සෙයින් වැඩි අගයක් ගනී. මෙම තත්වය විශ්‍රාම වැටුප් විෂමතාවය් ඊළඟ පැති කඩයි. මෙම විෂමතාවයේ බලපෑම එපමණකින්ම නොනැවතේ. වසර 3 කට වරක් විශ්‍රාම වැටුප වැඩිකිරීමේදී ද, එය කොටස් 02 කට බෙදා අනුපාත 2ක් අදාල කරන ලදී. උදා:- වශයෙන් 1980 ට පෙර විශ්‍රාම ගිය අය සඳහා එක අනුපාතයකුත්, 1980 ට පසු විශ්‍රාම ගිය අය සඳහා තවත් අනුපාතයකුත් යනාදී වශයෙන් මෙම තත්වය යටතේද, විශ්‍රාම වැටුප් අතර විෂමතාවයක් ගොඩ නැගින.

තවද මෙසේ කොටස් 2 කට බෙදන කඩඉම් වර්ෂයද කීප විටක් වෙනස් කර ඇත. උදා:- වශයෙන් 1997දී එය 1980යි. නමුත් 2006 වර්ෂයේදී මෙම කඩඉම් වර්ෂය 1991 ලෙස සලකා ඇත. 2009 වර්ෂයේදී කඩඉම් වර්ෂය නැවත වෙනස් කොට එය 2000 ලෙස සලකා ඇත. මෙම තත්වයද, විශ්‍රාම වැටුප් අතර, විෂමතාව තීව්‍ර කිරීමට හේතුවී ඇත.

මේ අනුව බලන විට, ශ්‍රී ලංකා මහ බැංකු පාලනාධිකාරිය කලින් කලට ගෙන ඇති තීරණ හේතු කොට ගෙන, විශ්‍රාම වැටුප් අතර විශාල පරතරයක් නැතහොත් විෂමතාවයක් ගොඩනැගී ඇත. මෙම තත්වය තාත්වික දත්ත ඇසුරෙන් පහත පෙන්වා ඇත.

| Grade | Post at Retirement | Retired Year | Basic Pension |
|---|---|---|---|
| SO 5 | Excutive Director | 1991 | 26,793 |
| SO 4 | Additional Controller | 1993 | 32,831 |
| SO 4 | Director | 1998 | 38,403 |
| SO 4 | Director | 2000 | 47,186 |
| SO 5 | Director | 2006 | 75,259 |
| SO 1 | Assistant Director | 1994 | 21,734 |
| SO 1 | Assistant Director | 1997 | 23,143 |
| SO 1 | Assistant Director | 2002 | 29,812 |
| SO 1 | Assistant Director | 2005 | 38,934 |
| SO 1 | Assistant Director | 2008 | 52,509 |
| NSO 5 | Staff Assistant Supra | 1997 | 23,301 |
| NSO 5 | Staff Assistant Supra | 2002 | 26,584 |
| NSO 5 | Staff Assistant Supra | 2005 | 37,387 |
| NSO 5 | Staff Assistant Supra | 2009 | 69,895 |

01

# විශ්‍රාම වැටුප් විෂමතාවය යනු කුමක්ද? විමසා බැලීමක්

ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාම වැටුප් ක්‍රමයේ ආරම්භය 1957 ජනවාරි 01 දා තරම් ඈත අතීතයක් කරා දිව යයි. එහෙත් මාසික විශ්‍රාම වැටුප් ක්‍රමය ආරම්භ වූයේ 1965 ජනවාරි 01 දිනයි. එය වරින් වර විවිධ වෙනස් කම් වලට භාජනය වෙමින් 1997 දෙසැම්බර් 31 දිනෙන් ඇවර විය. මෙම වෙනස්කම් වලින් ප්‍රධාන වෙනස්කම් 2ක් පමණක් ඉහත මාතෘකාවට අදාල බැවින් ඒ පිළිබඳව විමසා බලමු

01. විශ්‍රාම වැටුපේ ප්‍රමාණය තිරණය කල යුතු ආකාරය පිළිබඳ ඇතිවූ වෙනස්කම්.
02. විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් බැර කිරීම පිළිබඳ ඇතිවූ වෙනස්කම්.

<u>විශ්‍රාම වැටුපේ ප්‍රමාණයේ ඇතිවූ වෙනස්කම</u>

ආරම්භක අවස්ථාවේදී විශ්‍රාම වැටුපේ ප්‍රමාණය ගණනය කරන ලද්දේ පහත සඳහන් ආකාරයටය.

01.

$$\frac{\text{සේවාවේ සම්පූර්ණ කළ මාස ගණන} + 60}{720} \times \text{අවසන් අවුරුදු තුනෙන් ලබා ගත් මාසික මූලික වැටුප් සාමාන්‍යය}$$

(විශ්‍රාම වැටුප, වැටුපෙන් 2/3 ක උපරිමයට යටත්ව)

02.

1974 ජුලි මස 16 වෙනි දින සිට එය පහත සඳහන් ආකාරයට වෙනස් විය.

$$\frac{\text{සේවාවේ සම්පූර්ණ කළ මාස ගණන} + 60}{720} \times (\text{අවසාන කල්පිත මූලික වැටුප් සාමාන්‍යය} + \text{ඒකාබද්ධ ජීවන වියදම් දීමනාව අදාල තැන්හිදී විවාහ දීමනාව})$$

(විශ්‍රාම වැටුප, වැටුපෙන් 2/3 ක උපරිමයකට යටත්ව)

03. 1985 ජනවාරි 01 ක්‍රියාත්මක වන පරිදි මාසික විශ්‍රාම වැටුප ගණනය කරන ලද්දේ පහත සඳහන් ආකාරයටය. එනම් පහත සඳහන් ආකාරයට ගණනය කරන ලද විශ්‍රාම වැටුප ඊට පහතින් දී ඇති වක්‍රයේ අනුපාතයන්ට ගලපන ලදී.

i. අවසාන මාසයේ මූලික වැටුප.
ii. නිවාස කුලී දීමනාව.
iii. (මූලික වැටුප + නිවාස කුලී දීමනාව) × 10%
iv. රු.140 විශ්‍රාම දීමනාව.
v. රු.125 දීමනාව.
vi. අදාල තැන්හිදී විවාහ දීමනාව.

මේ සියල්ලේම එකතුව පහත සඳහන් අනුපාතයට ගලපන ලදී.

| වයස | | | | | |
|---|---|---|---|---|---|
| 55 | 56 | 57 | 58 | 59 | 60 |
| ප්‍රතිශතය | | | | | |
| 80 | 81 | 82 | 83 | 84 | 85 |